



# 2017

## වාර්ෂික කාර්යසාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## ANNUAL PERFORMANCE REPORT






කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය
தொழில், தொழிற் சங்க உறவுகள் மற்றும் சப்பிரகமுவ அபிவிருத்தி அமைச்சு
Ministry of Labour, Trade Union Relations and Sabaragamuwa Development

**කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා**
**සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය**

# වාර්ෂික
# කාර්යසාධන වාර්තාව
# 2017

**සම්පාදනය**
සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

**ප්‍රකාශනය**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය

**වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2017**

**සම්පාදනය**
සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

**ප්‍රකාශනය**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය

තැ. පෙ. 1519, දෙවන මහල,
කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.

**මුද්‍රණය**
ප්‍රින්ටෙක් එස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම
52/1, එක්වත්ත පාර, මිරිහාන, නුගේගොඩ.
දුරකථන - 011 2815813/ විද්‍යුත් තැපෑල - sales@printec.lk
වෙබ් අඩවිය - www.printec.lk

Printed with VOC free, non toxic vegetable oil-based environmentally-friendly ink, on 100% recycled paper using wood free pulp which is made from 100% post consumer waste paper
(Paper recycling is the process of recovering waste paper and remarking it into new paper products.)

Recycling one ton of paper saves
17 mature trees, 26 m3 of water, 2.3 m3 of disposal space, 320 liters of oil, and 4,100 kilowatt-hours of electricity.

We encourage you to recycle this Document after use.

# කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2017

## ඇතුල් පිටු


**පිටුව**

- කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය
  **ගරු. ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමාගේ පණිවුඩය** iv
- කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍ය
  **ගරු. රවින්ද්‍ර සමරවීර මැතිතුමාගේ පණිවුඩය** vi
- කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශ
  ලේකම්තුමාගේ පණිවුඩය viii
- කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යාංශ
  ලේකම්තුමාගේ පණිවුඩය x
- හැඳින්වීම 01

**අමාත්‍යාංශ කාර්යසාධනය** 05

I. පාලන හා ආයතන අංශය 05
II. මුදල් අංශය 07
III. සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය 08
IV. කම්කරු හා විදේශ සම්බන්ධතා අංශය 10
V. සබරගමුව සංවර්ධන අංශය 11

**අමාත්‍යාංශය යටතේ වූ ආයතන** 12

I. කම්කරු දෙපාර්තමේන්තුව 12
II. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 25
III. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 31
IV. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය 32
V. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය 36
VI. ශ්‍රම වාසනා අරමුදල 38

**ඡායාරූප - අමාත්‍යාංශයේ විශේෂ ක්‍රියාකාරකම්** 40



## කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සබරගමුව සංවර්ධන අමාත්‍ය
## ගරු ඩබ්ලිව්.ඩී.ජේ සෙනෙවිරත්න මැතිතුමාගේ පණිවුඩය

කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සබරගමුව සංවර්ධන අමාත්‍යාංශයෙහි 2017 වර්ෂයෙහි ප්‍රගතිය විමසා බැලෙන කාර්යසාධන වාර්තාව සඳහා පණිවුඩයක් නිකුත් කරනු ලබන්නේ ඉමහත් සතුටින් සහ අභිමානයෙනි.

කම්කරු අමාත්‍යාංශය රට තුළ කාර්මික සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය සක්‍රීය මැදිහත්වීම සිදුකරයි. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ අණපනත් ක්‍රියාත්මක කිරීම අපගේ ප්‍රමුඛ කාර්යයයි. වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් ත්‍රෛපාර්ශවීය සබඳතා ඔස්සේ එම වගකීම ඉටු කිරීමට අපි බැඳී සිටින්නෙමු.

රටේ ආර්ථික සංවර්ධනයට  අසු  ලක්ෂයක් ඉක්ම වූ පෞද්ගලික අංශයේ සේවකයෝ  දායක වෙති. විවිධ ආයතන දෙලක්ෂ පනස් දහසක් පමණ අපගේ පරිපාලන රාමුවට යටත්ය. එම ආයතනවල සේවකයන්ට බලපාන කම්කරු නීති, අණ පනත් ක්‍රියාත්මක කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය, කාර්මික ආරවුල්, වැඩවර්ජන සමථයට පත් කිරීම අපගේ විෂය පථයට අයත් ප්‍රමුඛ කාර්යයන් වේ. එසේම වැඩකරන ජනතාවගේ වෘත්තීය සුරක්ෂිතභාවය, සෞඛ්‍ය, සුබසාධනය වෙනුවෙන් අවශ්‍ය රෙගුලාසි පැනවීම, ඒවා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ පසු විපරම ද අපගේ වගකීමකි. මේ සියලු කාර්යයන් සඳහා කම්කරු දෙපාර්තමේන්තුව ඇතුළු අනිකුත් අනුබද්ධ ආයතනයන් මගින් ලබා දෙන සහයෝගය අතිමහත්ය.

අද වන විට රට තුළ ශක්තිමත් වෘත්තීය සමිති ව්‍යාපාරයක් ක්‍රියාත්මක වේ. වැඩ කරන ජනතාවට කිසිදු බියකින් තොරව වෘත්තීය සමිති හා සම්බන්ධ වෙමින් තම අයිතිවාසිකම් දිනා ගැනීමට අවශ්‍ය පරිසරය අද රට තුළ නිර්මාණය වී ඇත. අපි රජයක් ලෙස වෘත්තීය සමිති සමග සාකච්ඡාවෙන්, සම්මුතියෙන් ප්‍රශ්න විසඳා ගැනීමට කැපවී සිටින්නෙමු. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග එක්ව ළමා ශ්‍රමය පිටුදැකීමේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට අද අපට හැකිව තිබේ. ඒ සඳහා අවශ්‍ය ජාතික ප්‍රතිපත්තියද දැන් ක්‍රියාත්මකය. අයවැය සහන දීමනා පනත පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගනිමින් පෞද්ගලික අංශයේ සේවකයන්ට රුපියල් 2,500 කින් වැටුප් වැඩි කර දීම අප ලැබූ විශාල ජයග්‍රහණයකි. එසේම පෞද්ගලික අංශයේ ජාතික අවම වේතනය රුපියල් 10,000 ක් බවට පත් කිරීමට ද අප සමත් විය. කාර්යක්ෂම සේවාවක්

ලබා දීම වෙනුවෙන් රට පුරා නවීන පහසුකම් සහිත කම්කරු කාර්යාල ගණනාවක් ඉදිකර ජනතා අයිතියට පත් කිරීමටද අපට හැකිවිය. ජාතික කම්කරු උපදේශන සභාව අඛන්ඩව රැස් කරමින් කම්කරු ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් අවශ්‍ය ක්‍රියමාර්ග රැසක් ගැනීමට අපට හැකි විය. කම්කරු අණපනත් කාලානුරූපීව වෙනස් කිරීමට අවශ්‍ය පියවර ද ගනු ලැබීය.

යහපත් රාජ්‍ය පාලන තන්ත්‍රයක් රට තුළ ස්ථාපිත කිරීමට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලබා දෙන නායකත්වය අතිශය වැදගත්ය. එසේම මේ සියලු කාර්යයන් සඳහා මා හට නිසි සහය ලබා දෙන රාජ්‍ය අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමාටත් අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතවේදී ස්තූතිය පුදකරමි.

**ඩබ්ලිව්.ඩී.ජේ සෙනෙවිරත්න (පා. ම.)**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සබරගමුව සංවර්ධන අමාත්‍ය



## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍ය
## ගරු රවීන්ද්‍ර සමරවීර මැතිතුමාගේ පණිවුඩය

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය මගින් 2017 වර්ෂයේ අමාත්‍යාංශ ප්‍රගතිය සම්බන්ධව නිකුත් කරනු ලබන වාර්ෂික කාර්යසාධන වාර්තාවට සුභ පැතුම් පණිවුඩයක් ලබා දෙන්නේ ඉමහත් සතුටිනි.

දිවයින පුරා සේවය කරනු ලබන අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින්ගේ සුබසාධනය අරමුණු කරගෙන කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය මගින් 2017 වර්ෂයේ ක්‍රියාවට නංවා ඇති වැඩසටහන් රාශියකි.

මෙම අමාත්‍යාංශය යටතේ පවත්නා කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ශ්‍රම වසනා අරමුදල් මණ්ඩලය, මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය එක්ව කම්කරු ප්‍රජාවගේ සුභසාධනය වෙනුවෙන් අතිමහත් සේවයක් ඉටුකර ඇත.

කම්කරු ආරවුල්, වැඩ වර්ජන සම්බන්ධයෙන් අමාත්‍යාංශය මැදිහත් වීම තුලින් ඒවා සමථයට පත් කිරීමටත් එමගින් කාර්මික සාමය ඇතිකර රටේ සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමටත් ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුබ සාධනය සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමත්, කම්කරු සබඳතා වලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතුත් වර්ෂය තුළ ක්‍රියාවට නංවා ඇත.

වෘත්තීය සමිති ලියා පදිංචි කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනය සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වාදීමත්, ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කර තිබේ.

වර්ෂය තුළ කම්කරු පරීක්ෂණ, කම්කරු ආරවුල් නඩු කඩිනම් කිරීම, රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතුත් වෘත්තීය මාර්ගෝපදේශනත්, මිනිස්බල සැපයුම් හා සංවර්ධනය පිළිබඳ පර්යේෂණ සිදු කිරීමත්

අවශ්‍ය මහජන රැකියා සේවා මධ්‍යස්ථාන ආරම්භ කර දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන් මගින් රැකියා අවස්ථා උදාකරලීමටත් ක්‍රියාකර තිබේ.

රටේ සංවර්ධන ක්‍රියාවලියට දායකවීම වස් අමාත්‍යාංශයේ අරමුණු ඉටුකරලීම පිණිස මූලික වූ කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය ගරු ඩබ්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමාටත්, අමාත්‍යාංශ ලේකම් එස්. ඒ. එන්. සරණතිස්ස මැතිතුමාටත්, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් සුනිල් අබේවර්ධන මැතිතුමාටත් අමාත්‍යාංශයේ සියලුම නිලධාරීන්ටත් අමාත්‍යාංශය යටතේ ඇති සියලු ආයතන ප්‍රධානීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් මාගේ ප්‍රණාමය පුද කරමි.

**රවීන්ද්‍ර සමරවීර (පා. ම.)**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍ය.



# කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශයේ **ලේකම්තුමාගේ පණිවුඩය**

කම්කරු, වෘත්තිය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතන විසින් 2017 වර්ෂයේ දී අත්පත් කරගත් කාර්යසාධනය විස්තර කෙරෙන්නා වූ මෙම ප්‍රකාශනය ඔබ අතට පත්කරන්නේ ඉමහත් සතුටිනි.

සේව්‍ය, සේවක හා රජය අතර වූ ත්‍රෛපාර්ශවීය සම්බන්ධතාවය ශක්තිමත් කිරීම තුළින් වැඩබිමේ සාමය හා සංහිඳියාව ශක්තිමත් කිරීම උදෙසා මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති වගකීම අතිමහත් වේ. ඒ අනුව ජාත්‍යන්තර කම්කරු අයිතිවාසිකම් තව දුරටත් ශක්තිමත් කිරීම හා යහපාලන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මඟින් කම්කරු අයිතීන් සඳහා පෙළ ගැසෙන ශ්‍රී ලාංකීය කම්කරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා නිර්මාණය කළ පුළුල් වපසරිය 2017 වර්ෂයේදී තව දුරටත් ඉදිරියට ගෙන ඒමට හැකි වූ බව අභිමානයෙන් යුක්තව සඳහන් කරන්නෙමි. එනම් යහපාලන ප්‍රතිපත්ති, 2020 හා 2025 දැක්ම හා ප්‍රතිපත්ති රාමුව යටතේ වැඩකරන ජනතාවගේ කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීමට ප්‍රතිපත්ති හා වැඩසටහන් රාශියක් ආරම්භ කිරීමට හැකිවිය.

එමෙන්ම සේව්‍ය, සේවක හා රජය අතර වූ ත්‍රෛපාර්ශවීය සබඳතාවය ශක්තිමත් කිරීම හා සබරගමුව පළාත සංවර්ධනය උදෙසා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අමාත්‍යාංශයට පැවරී ඇති මූලික වගකීමයි. 2017 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා සමාලෝචිත කාලවකවානුව තුළ මෙකී වගකීම උදෙසා අමාත්‍යාංශයත් අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනයන් වූ කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව, ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය හා ශ්‍රම වාසනා අරමුදල විසින් සුවිශේෂී කාර්යභාරයන් ඉටු කරනු ලැබීය.

කම්කරු උපදේශක සභා සවිබල ගැන්වීම හා සේවක අර්ථසාධක අරමුදල් පනත, කම්කරු වන්දි අඥාපනත, පඩිපාලක සභා ආඥා පනත, සාප්පු හා කාර්යාල අඥා පනත හා ශ්‍රම වාසනා අරමුදල් පනත සංශෝධනය කිරීම මඟින් ඒවායේ ආවරණය පුළුල් කිරීමට කටයුතු කරමින් සිටි. එසේම ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් එළි දැක්වීමට කටයුතු කළ අතර

ළමා ශ්‍රමය පිටු දැකීමට අවශ්‍ය නීතීමය රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරමින් සිටී. තවද ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන, ආයතන හා රටවල් සමඟ පවතින සබඳතා ශක්තිමත් කිරීම හා කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම තුළින් යුරෝපා වෙළඳ පොළ සඳහා වර්ණාත්මක තිරුබදු සහනය (GSP+) ලබා ගැනීමට ඉහළ දායකත්වයක් ලබා දිය හැකි වීම සතුටට කරුණකි. එමෙන්ම රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා සබරගමුව පළාත තුළ යටිතල පහසුකම් හා ජීවනෝපාය මාර්ග සංවර්ධන වැඩසටහන් 2018 වර්ෂයේ දී ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

ඉහත සඳහන් කළ කාර්යයන් ඉටුකිරීමට අවශ්‍ය නායකත්වය, මගපෙන්වීම හා අනුශාසකත්වය ලබාදුන් කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය ගරු ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිඳුන්ට හා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිඳුන් වෙත කෘතඥතාව පළ කරමි. එසේම ඉහත කාර්යසාධනය අත්කර ගැනීමෙහිලා මහත් වූ කැපවීමෙන් ක්‍රියා කළ අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම්, අතිරේක ලේකම් ඇතුලු කාර්ය මණ්ඩලයටත්, කම්කරු කොමසාරිස් ජනරාල්, මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, කම්කරු වන්දි කොමසාරිස්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා ශ්‍රම වාසනා අරමුදලේ සාමාන්‍යාධිකාරී සහ එම ආයතනවල සියලුම මට්ටම්වල නිලධාරීන්ටත්, මෙම ප්‍රකාශනය පිළියෙල කළ අමාත්‍යාංශයේ සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශයේ සියලුම නිළධාරින්ටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

**එස්. ඒ. නිමල් සරණතිස්ස**
ලේකම්
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය



## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යාංශයේ
## **ලේකම්තුමාගේ පණිවුඩය**

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, ශ්‍රම වාසනා අරමුදල හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය යන ආයතනවල 2017 වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් සැකසෙන වාර්ෂික වාර්තාව වෙනුවෙන් සුභ පැතුම් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම පිළිබඳව සතුට පළ කරමි.

මෙම අමාත්‍යාංශය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුලු ජාත්‍යන්තර සංවිධාන, ආයතන හා රටවල් සමඟ සබඳතා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම, කම්කරු ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ කටයුතු සිදුකිරීම, කාර්මික සාමය පවත්වාගෙන යාම උදෙසා සේව්‍ය සේවක හා රජය අතර ත්‍රෛපාර්ශ්වික සම්බන්ධතා ශක්තිමත් කිරීම් වස් ජාතික කම්කරු උපදේශන සභාවේ ක්‍රියාකාරි දායකත්වය ලබාගැනීම සහ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම සිදු කරනු ලබයි.

එසේම කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම, අනර්ථකාරී ළමා ශ්‍රමය තුරන් කිරීම, සේව්‍ය සේවක සමගිය උදෙසා සමාජ කතිකාවත වැඩ සටහන් පැවැත්වීම, පළාත්බද කම්කරු කාර්යාල සඳහා නව ගොඩනැගිලි පහසුකම් ලබා දීම, අමාත්‍යාංශය සඳහා ''මෙහෙවර පියස'' කාර්යාල සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු ඉදිරියට ගෙනයාම ඇතුළු කටයුතු රාශියක් කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි.

තවද ශ්‍රී ලංකාවේ රැකියා අපේක්ෂිත තරුණ පිරිස් රැකියා සඳහා යොමුකිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ සපයාදීම සහ ස්වයං රැකියා සඳහා පුහුණුවීම් ලබාදීම ඇතුළු කටයුතු රාශියක් මිනිස්බල හා රැකි රක්ෂා දෙපාර්තමේන්තුව විසින් දියත් කර ඇත. ඊට සමගාමීව 2017 වර්ෂය තුළ රැකියා සේවා (PES) මධ්‍යස්ථාන ප්‍රතිසංවිධානය කොට දිස්ත්‍රික්ක 08 ක විවෘත කිරීම හා රැකියා පොළ වැඩසටහන් දිවයින පුරා පැවැත්වීම තුළින් පෞද්ගලික අංශයේ රැකියා සඳහා තරුණ පිරිස් වලට අවස්ථාව ලබා දීමට ක්‍රියා කොට ඇත.

වැඩකරන ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ මූලිකත්වයෙන්

වැඩසටහන් රාශියක් 2017 වසරේදී පවත්වන ලදි. එසේම කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ මූලිකත්වයෙන් අනතුරු වලට ලක්වූවන්ට වන්දි සහන ලබාදීමේ කටයුතු අඛණ්ඩව ඉටුකරමින් දැනට ලබාදෙන වන්දි මුදල වැඩිකිරීමට අදාළ නීති සම්පාදනයට අවශ්‍ය මූලික පියවර ගනිමින් සිටී. පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සේවක පිරිස් උදෙසා කෙටිකාලීන හා දිගුකාලීන පුහුණු වැඩසටහන් රාශියක් ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන අතර කම්කරු ප්‍රජාවගේ සුභ සාධනය අරඹයා ශ්‍රම වාසනා අරමුදලින් අඩු ආදායම්ලාභී පවුල් නඟා සිටුවීම උදෙසා වැඩ සටහන් රාශියක් ක්‍රියාවට නඟා ඇත.

මෙම සියලු කටයුතු ඉටුකිරීමේදී ඒ සදහා අවශ්‍ය නායකත්වය හා මග පෙන්වීම ලබාදෙන කම්කරු, වෘත්තිය සමිති සබදතා හා සබරගමුව සංවර්ධන ගරු අමාත්‍ය ඩබ්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමා, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු රාජ්‍ය අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා හා මෙම කටයුතු මැනවින් ක්‍රියාත්මක කරනු ලබන අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළුකාර්යය මණ්ඩලයටද  මගේ ස්තුතිය පුද කරමි.

**සුනිල් අබේවර්ධන**
ලේකම්
කම්කරු හා වෘත්තිය සමිති සබදතා රාජ්‍ය අමාත්‍යාංශය

01

# කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත වූවන්ගේ ජීවන හා සේවා තත්ත්වයන් වර්ධනය කිරීම මෙන්ම රටේ නිෂ්පාදනය හා ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමට අවශ්‍ය වන කාර්මික සාමය සහ සේව්‍ය-සේවක සබඳතාව ස්ථාපනය කරමින් අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශයේ මූලික පරමාර්ථය වේ. සේවක ජනතාවගේ සුබසාධනය උදෙසා වරින්වර ඇතිකරන ලද කම්කරු නීති හා අණපනත් අනුව මෙම අමාත්‍යාංශයට පැවරෙන කාර්යභාරයද පුළුල්ය. ඒ අනුව අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර පහත පරිදි වේ.

## දැක්ම

තෘප්තිමත් ඵලදායී ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

## මෙහෙවර

කාර්මික සාමය හා සහයෝගීතාව, සමාජ සුරක්ෂිතභාවය, කම්කරු අයිතිවාසිකම් හා ඵලදායිතාව තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම.

**කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය**

- **කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යාංශය**
- **අමාත්‍යාංශ කාර්යාලය**
  - පාලන හා ආයතන අංශය
  - මුදල් අංශය
  - සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
  - කම්කරු සහ විදේශ සබඳතා අංශය
  - සබරගමුව සංවර්ධන අංශය
- **කම්කරු දෙපාර්තමේන්තුව**
- **මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව**
- **ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය**
- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය**
- **කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය**
- **ශ්‍රම වාසනා අරමුදල**

## අමාත්‍යාංශයේ අරමුණු


- ත්‍රෛපාර්ශවය සවිබල ගැන්වීම තුළින් සේව්‍ය සේවක සබඳතා ශක්තිමත් කිරීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීම.
- ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම.
- රැකියාවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම, ආරක්ෂා කිරීම හා ස්ත්‍රී පුරුෂ සමානතාව දිරිගැන්වීම.
- කම්කරු නීති රීති හා පටිපාටිවල නම්‍යශීලීත්වය ඉහළ නැංවීම.
- සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම.

## අමාත්‍යාංශය වෙත පැවරී ඇති රාජකාරී

2015.09.21 දින ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට පවරන ලද බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් පහත දැක්වේ.

1. කම්කරු හා වෘත්තීය සමිති සබඳතා විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්, සේවක පරිපාලනය සහ සුභසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
3. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමග අන්තර් සහයෝගිතාව පවත්වා ගැනීම.
4. සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය කිරීම.
5. කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම.
6. කම්කරු සබඳතාවලට අදාළ නීතිරීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු.
7. වෘත්තීය සහ රැකියා මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
8. වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම.
9. ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
10. රැකියා නියුක්ති ආයතන විසින් ගාස්තු අය කිරීම නියාමනය කිරීම.
11. විරැකියා ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළ කටයුතු.
12. වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
13. කම්කරු දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ශ්‍රම වාසනා අරමුදල සහ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව යන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු හා අධීක්ෂණය.
14. 2016.09.01 අංක 1982/30 දරණ ගැසට් පත්‍රය මගින් කම්කරු හා වෘත්තිය සමිති රාජ්‍ය අමාත්‍යාංශය යටතට මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය යන ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයිම පවරා ඇත.
15. 2017.06.09 දිනැති අංක 2022/34 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් කම්කරු හා වෘත්තිය සමිති අමාත්‍යාංශයේ විෂය පථයට සබරගමුව සංවර්ධන කාර්යන් ස්ථාපනය කර පහත සඳහන් පරිදි පුළුල් කර ඇත.
    I. සබරගමුව පළාත තුළ විශේෂ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා සම්බන්ධීකරණය.
    II. සබරගමුව පළාත තුළ සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය.

## සංවිධාන ව්‍යුහය




ජ්‍යෙ.ස.ලේ - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | වි.ස - විදේශ සබඳතා | සැ.ප.සං. - සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන | කා.කා.ස - කාර්යාල කාර්ය සහායක

## කාර්ය මණ්ඩල තොරතුරු - 2017.12.31 දනට

| | ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුක්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| 1 | අමාත්‍යාංශ කාර්යාලය | 22 | 12 | 5 | 4 | 80 | 53 | 41 | 30 | 148 | 99 | 49 |
| 2 | කම්කරු දෙපාර්තමේන්තුව | 210 | 154 | 668 | 526 | 1,771 | 1,355 | 489 | 460 | 3,138 | 2,495 | 643 |
| 3 | මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව | 15 | 9 | 4 | 0 | 673 | 566 | 15 | 13 | 707 | 588 | 119 |
| 4 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 09 | 03 | 13 | 07 | 18 | 10 | 05 | 03 | 45 | 23 | 22 |
| 5 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය | 03 | 03 | 07 | 02 | 10 | 07 | 05 | 05 | 25 | 17 | 08 |
| 6 | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය | 04 | 03 | 03 | 02 | 31 | 22 | 05 | 03 | 43 | 30 | 13 |
| 7 | ශ්‍රම වාසනා අරමුදල | 01 | 01 | 02 | 02 | 08 | 08 | 04 | 04 | 15 | 15 | 0 |
| | **මුළු සේවක සංඛ්‍යාව** | **264** | **185** | **702** | **543** | **2,591** | **2,021** | **564** | **518** | **4,121** | **3,267** | **854** |

## ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන අණ පනත්

1. 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනත.
1. 1935 අංක 14 දරන වෘත්තිය සමිති අඥා පනත.
2. 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර අඥා පනත.
3. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත.
4. 1942 අංක 45 දරන කර්මාන්තශාලා අඥා පනත.
5. 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත.
6. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත.
7. 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත.
8. 1956 අංක 37 දරණ ගාස්තු අයකිරීමේ රැකියා නියුක්ති නියෝජිතායතන පනත.
9. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත.
10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ සේවා නියුක්තිය අවසන් කිරීමේ ( විශේෂ විධිවිධාන) පනත.
11. 1979 අංක 32 දරන සේවක මණ්ඩල පනත.
12. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත.
13. 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල් පනත.
14. 2009 අංක 38 දරන වෘත්තිය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත.
15. 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත.
16. 2016 අංක 03 දරණ සේවකයින්ගේ ජාතික අවම වේතන පනත.
17. 2016 අංක 04 දරණ අයවැය සහන දීමනා පනත.

# අමාත්‍යාංශ කාර්යසාධනය

## පාලන හා ආයතන අංශය

පරිපාලන අංශය, ආයතන අංශය හා මාධ්‍ය ඒකකය පාලන හා ආයතන අංශයේ විෂය පථයට ඇතුළත් වේ. පාලන අංශයට සාමාන්‍ය පරිපාලනය, ප්‍රසම්පාදන කටයුතු, කළමනාකරණය, නඩත්තු කටයුතු, පුහුණු කිරීම්, තොරතුරු තාක්ෂණය සම්බන්ධ කටයුතු හා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන් සම්බන්ධීකරණය කිරීම යනා දී වගකීම් සම්භාරයක් පැවරී ඇත. ආයතන අංශය මඟින් අමාත්‍ය කාර්යාලයේ හා රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ කටයුතු සිදු කරනු ලබයි. එසේම අමාත්‍යාංශය යටතේ තිබෙන කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය, ශ්‍රම වාසනා අරමුදල හා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය යන ආයතනයන්හි මානව සම්පත් කළමනාකරණයට අදාළ කටයුතු හා පරිපාලනය මෙම අංශය හරහා ඉටු කරනු ලැබේ. එසේම පාර්ලිමේන්තු ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභාව, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, මානව හිමිකම් කොමිෂන් සභාව යනාදී කාර්යාල මඟින් හා මහජනතාව විසින් එවනු ලබන විවිධාකාර ඉල්ලීම් හා පෙත්සම් සම්බන්ධයෙන් ද ආයතන අංශය කටයුතු කරනු ලබයි.

- **මානව සම්පත් සංවර්ධනය**

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනයන්හි නිලධාරීන් හට දෙමළ භාෂා දැනුම වර්ධනය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමඟ එක්ව පාඨමාලා සංවිධානය කරන ලදි. පාලන අංශය මඟින් අමාත්‍යාංශයේ නිලධාරීන්ට තම සේවා අවශ්‍යතාව මත පශ්චාත් උපාධි පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීමට මූල්‍ය පහසුකම් සැලසීම ඇතුළු අවශ්‍ය අනෙකුත් පහසුකම් සලසා දෙන ලදී. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, වරලත් ගණකාධිකාරී ආයතනය, ශ්‍රී ලංකා පදනම හා නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලබන පුහුණු වැඩමුළු සඳහා නිලධාරීන් සහභාගී කරවන ලදි.

කාර්මික විද්‍යාල මඟින් පුහුණුව ලැබූවන් සඳහා පරිගණක ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා ඔවුන් අමාත්‍යාංශයේ විවිධ අංශවල පුහුණුව සඳහා යොමු කර ඇත.

2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 77 දෙනෙකු පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවා ඇත.

අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ ඵලදායිතා ප්‍රවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් 05ක් පවත්වන ලද අතර ඒ අනුව ඵලදායිතා කව පිහිටුවා කෙටිකාලීන හා දීර්ඝකාලීන ඵලදායිතා ක්‍රමවේදයන් හඳුනා ගැනීම, ක්‍රියා කිරීම හා නියාමනය කිරීම සිදු කරමින් පවතී.

- **වෙනත් විශේෂ කටයුතු**

**1980 ජූලි වර්ජකයින් සඳහා සහන සැලසීම**

2016.01.01 දින සිට 2016.12.31 දින දක්වා 1980 ජූලි වැඩ වර්ජනය හේතුවෙන් රැකියාව අහිමි වූවන් 222 දෙනෙකුගේ නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කොට යොමු කොට ඇත. ඒ අනුව ඔවුන් සඳහා එක් අයෙකුට රු. 250,000/- බැගින් සියලු දෙනා වෙත සහන සැලසීම සඳහා රු. 55,500,000/- ක මුදලක් වැය වෙතැයි අපේක්ෂා කළ හැකිය. 2017.01.01 දින සිට 2017.12.31 වන දින දක්වා 1980 ජූලි වැඩ වර්ජනය හේතුවෙන් රැකියාව අහිමි වූවන් 155 දෙනෙකුගේ නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කොට යොමු කොට ඇත. ඒ අනුව ඔවුන් සඳහා එක් අයෙකුට රු. 250,000/- බැගින් සියලු දෙනා වෙත සහන සැලසීම සඳහා රු. 38,750,000/- ක මුදලක් වැය වෙතැයි අපේක්ෂා කළ හැකිය.

**තුල්හිරිය හා පූගොඩ පේෂ කර්මාන්තශාලාවල වැඩ වර්ජනය හේතුවෙන් රැකියාව අහිමි වූවන්ට සහන සැලසීම.**

2016 වසරේදී තුල්හිරිය හා පූගොඩ පේෂ කර්මාන්තශාලාවල රැකියා අහිමි වූ සේවකයින් 23,936 සඳහා රු. 25,000/- අවසන් කරුණා සහගත දීමනාවක් ලබාදෙන ලදි. පසුව තුල්හිරිය හා පූගොඩ පේෂ කර්මාන්තශාලාවල වැඩ වර්ජනය හේතුවෙන් රැකියාව අහිමි වූ පුද්ගලයින් සඳහා සේවා කාලය මත පදනම් වූ (1978 මාර්තු 18 සිට 2001 ජූනි මස පේෂ කර්මාන්ත සංස්ථාව පෞද්ගලීකරණය කිරීම දක්වා) පාරිතෝෂික

දීමනාවක් ලබාදීමට රු. මිලියන 165.3 මුදලක් ලබාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාලව අමාත්‍ය මණ්ඩල සන්දේශය අමාත්‍ය මණ්ඩල ලේකම් වෙත ඉදිරිපත් කොට ඇත.

2014 අයවැය මඟින් කරන ලද යෝජනාවක් අනුව 1980 ජූලි වැඩ වර්ජනයට ලක්ව රැකියා අහිමි වූ පෞද්ගලික හා රාජ්‍ය ආයතනයන්හි සේවකයන් සඳහා වන්දි ගෙවීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කරමින් මුදල් අමාත්‍යාංශය වෙත නිර්දේශ ලබා දී රැකියා අහිමි වූවන් වෙත සහන සැලසීමට කටයුතු කරමින් සිටී. ඒ අනුව 2015, 2016 වසර සඳහා අයදුම්කරුවන් 1,932ක් සඳහා ජූලි වර්ජක දීමනා ගෙවීම නිර්දේශ කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා 1980 ජූලි වර්ජකයින් 155ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කර යවා ඇත. ඒ අනුව 2017.12.31 වන විට 1980 ජූලි වර්ජකයින් 2087ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කර යවා ඇත.

## මහජන පැමිණිලි

කම්කරු අමාත්‍යාංශය වෙත මෙම වසරේ පෞද්ගලික අංශයේ ජනතාවගේ රැකියා ගැටලු සම්බන්ධ මහජන පැමිණිලි ලිපි 364ක් පමණ ලැබී ඇත. මෙම ගැටලු සඳහා කඩිනමින් විසඳුම් ලබා දීමට අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අංශවලට යොමු කර ගැටලු සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කරනු ලබයි.

''ජනපතිට කියන්න'' වැඩසටහන යටතේ 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව 1437 වන අතර එමඟින් පැමිණිලි 988 ක් විසඳා ඇත.

තොරතුරු පනත යටතේ තොරතුරු නිලධාරියෙකු හා අභියාචනා නිලධාරියෙක් පත්කර ඇති අතර පුරවැසියන්ගේ ඉල්ලීම් අනුව තොරතුරු ලබා දීම සිදුකරමින් පවති.

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අංශයේ ප්‍රගතිය**

තොරතුරු තාක්ෂණ භාවිතය ඉහළ නැංවීම වෙනුවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

- තොරතුරු තාක්ෂණ භාවිතය ඉහළ නැංවීම වෙනුවෙන් එහි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ, අන්තර්ජාල කටයුතු විධිමත්ව සිදු කිරීම උදෙසා UTM (Unified Threat Management) System එකක් මිලදී ගැනීම.
- අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ වැඩ කටයුතු විධිමත්ව මනා කාර්යක්ෂමතාවයකින් සිදු කිරීම වෙනුවෙන් High End Computer එකක් මිලදී ගැනීම හා එයට මෘදුකාංග ඇතුළත් කිරීම. (Windows 2016 Genuine)
- ආයතනික සේවකයන්ගේ රැකියා තෘප්තිය ඉහළ නැංවීම වෙනුවෙන් මෘදුකාංග හඳුන්වා දීම.
    - Letter Management System
    - Vehicle Management System

මෙකී අංශයන් සංවර්ධනය කිරීම තුළින් කාර්යාලීය කටයුතුවල දී සේවක පහසුව වැඩිදියුණු කිරීම මෙන්ම රැකියා තෘප්තිය උසස් කිරීම ද අපේක්ෂා කෙරේ.

# මුදල් අංශය

| වැඩසටහන | ව්‍යාපෘතිය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | ඉතිරිය ප්‍රතිපාදනය (රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| 1 | 1 | පුනරාවර්තන | 26,080,870 | 25,557,218 | 523,652 | 98.0 |
| | | මූලධන | 2,646,800 | 1,255,936 | 1,390,864 | 47.5 |
| | | එකතුව | 28,727,670 | 26,813,154 | 1,914,516 | 93.3 |
| 1 | 2 | පුනරාවර්තන | 79,145,630 | 78,625,542 | 520,088 | 99.3 |
| | | මූලධන | 40,033,400 | 24,348,918 | 15,684,482 | 60.8 |
| | | එකතුව | 119,179,030 | 102,974,460 | 16,204,570 | 86.4 |
| 1 | 11 | පුනරාවර්තන | 24,856,000 | 24,264,949 | 591,051 | 97.6 |
| | | මූලධන | 2,700,000 | 1,405,272 | 1,294,728 | 52.0 |
| | | එකතුව | 27,556,000 | 25,670,221 | 1,885,779 | 93.2 |
| 2 | 4 | පුනරාවර්තන | 50,588,200 | 50,102,148 | 486,052 | 99.0 |
| | | මූලධන | 1,074,700 | 136,169 | 938,531 | 12.7 |
| | | එකතුව | 51,662,900 | 50,238,317 | 1,424,583 | 97.2 |
| 2 | 5 | පුනරාවර්තන | 29,388,000 | 28,871,448 | 516,552 | 98.2 |
| | | මූලධන | 1,265,000 | 1,096,427 | 168,573 | 86.7 |
| | | එකතුව | 30,653,000 | 29,967,875 | 685,125 | 97.8 |
| 2 | 6 | පුනරාවර්තන | 9,900,000 | - | 9,900,000 | 0.0 |
| | | මූලධන | 3,500,000 | 1,450,163 | 2,049,837 | 41.4 |
| | | එකතුව | 13,400,000 | 1,450,163 | 11,949,837 | 10.8 |
| 2 | 3(2) | පුනරාවර්තන | 12,000,000 | 12,000,000 | - | 100.0 |
| | | මූලධන | 3,000,000 | 3,000,000 | - | 100.0 |
| | | එකතුව | 15,000,000 | 15,000,000 | - | 100.0 |
| 2 | 3(3) | පුනරාවර්තන | 3,200,000 | 3,200,000 | - | 100.0 |
| | | මූලධන | 2,000,000 | 1,969,682 | 30,318 | 98.5 |
| | | එකතුව | 5,200,000 | 5,169,682 | 30,318 | 99.4 |
| | මුළු එකතුව | පුනරාවර්තන | 235,158,700 | 222,621,305 | 12,537,395 | 94.7 |
| | | මූලධන | 56,219,900 | 34,662,567 | 21,557,333 | 61.7 |
| | | එකතුව | 291,378,600 | 257,283,872 | 34,094,728 | 88.3 |

මෙම අංශය විසින් 2016 විසර්ජන ගිණුම, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ''බී'' ගිණුම, පොදු තැන්පත් ගිණුම යන ගිණුම් නියමිත පරිදි ඉදිරිපත් කර ඇත.

**2018 වර්ෂය සඳහා අනුමත අයවැය ප්‍රතිපාදන**

| | පුනරාවර්තන (රු. 000') | ප්‍රාග්ධන (රු. 000') | එකතුව (රු. 000') |
|---|---|---|---|
| මෙහෙයුම් වැඩසටහන | 128,030 | 251,270 | 379,300 |
| සංවර්ධන වැඩසටහන | 130,121 | 516,810 | 646,931 |
| **එකතුව** | **258,151** | **768,080** | **1,026,231** |

## සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම් කිරීම, මෙම අංශයෙන් සිදු කෙරෙන ප්‍රධාන කාර්යභාරය වේ. මෙයට අමතරව පහත සඳහන් කාර්යයන්ද මෙම කාල පරිච්ඡේදය තුළ අංශය විසින් ඉටුකර ඇත.

1. අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාල පාර්ශව වෙත යොමු කිරීම.
   - කාර්යසාධන පාදක අයවැය සංවර්ධන වැඩසටහන යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම.
2. අමාත්‍යාංශය වෙත කම්කරු හා වෘත්තිය සමිති විෂයට අමතරව සබරගමුව පළාත තුළ සංවර්ධන කාර්යයන් සම්බන්ධීකරණය සඳහා ඵලදායි දායකත්වයක් ලබා දීම ලෙස විෂය පථය හා කාර්ය භාරය පුළුල් වී ඇත.
   ඒ සඳහා රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරු සමඟ සාකච්ඡා කර මෙතෙක් සබරගමුව පළාත තුළ අවධානය යොමු නොවුණු සංවර්ධන කටයුතු ඇතුලත් කර සංවර්ධන යෝජනා සැලැස්මක් සකස් කර ඒ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.
3. 06/2015 (1) ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම.
4. පාර්ලිමේන්තුවේ අයවැය කාරක සභා අවස්ථාව සඳහා ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම
5. 2017 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීම
6. ශ්‍රී ලංකා සේවක සඟරාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ සියලු කටයුතු සිදු කිරීම.
   - සමාලෝචන කාලයට අදාළව ශ්‍රී ලංකා සේවක සඟරාවේ කාණ්ඩ අංක 67 කාණ්ඩයේ - 4 වන කලාපය හා 68 කාණ්ඩයේ - 1 හා 2 කලාපයන් කාර්තුමය වශයෙන් නිකුත් කරන ලදී
7. අර්ධ වාර්ෂික පුවත් සඟරාවේ (Labour Eye) 01 කාණ්ඩයේ පළමු හා දෙවන කලාප ප්‍රකාශයට පත්කරන ලද අතර 02 කාණ්ඩයේ පළමු කලාපය එළි දැක්වීමට කටයුතු සිදු කරමින් පවතී.
8. යහපත් රැකියා පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

සුනිසි මෙහෙවර වැඩ සටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 9.945 ක් පහත සඳහන් ආයතන වලට වෙන් කර ඇත.

| ව්‍යාපෘති ක්‍රියාත්මක වන ආයතන | වෙන් කළ මුදල (රු. මිලියන) | 2017.12.31 දිනට ප්‍රගතිය (රු.මි) |
|---|---|---|
| 1. කම්කරු දෙපාර්තමේන්තුව | 5.825 | 5.278 |
| 2. මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව | 2.000 | 1.940 |
| 3. අමාත්‍යාංශය | 2.120 | .582 |
| | **9.945** | **7.800** |

9. කම්කරු විෂය ක්ෂ්ත්‍රය පිළිබඳව පර්යේෂණ වාර්තා කැඳවා ඉන් තෝරාගත් හොඳම වාර්තා 05ක් තෝරාගෙන විද්වත් කතිකාවක් 2017 නොවැම්බර් මාසයේ 30 වැනි දින පැවැත්වීමට කටයුතු කළ අතර එම වාර්තා කැටිකර ජර්නලයක් වශයෙන් මුද්‍රණය කිරීමට සැලසුම් කර ඇත.

10. කම්කරු අධිකරණවල කටයුතු කරන බේරුම්කරුවන් සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නඩු හා කාර්මික සබඳතා සම්බන්ධ කටයුතු වල නියුක්ත නිලධාරීන් සඳහා වැඩමුළුවක් 2017.12.21 දින කොළඹදී පවත්වන ලදී. මෙහිදී කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා අත්දැකීම් සහිත දේශකයින් සිව්දෙනෙකු විසින් දේශන පවත්වන ලදී. මෙය බේරුම්කරුවන්ගේ සහ නිලධාරීන්ගේ දැනුම, මෑත කාලීන ප්‍රවණතා හා නඩු තීන්දු පිළිබඳ අවබෝධය වර්ධනයටත් ඔවුන් අභිප්‍රේරණයටත් ඉවහල් විය. ඒ තුළින් බේරුම්කරණ කටයුතු වඩාත් කාර්යක්ෂම වේ යැයි අපේක්ෂා කෙරේ.

11. කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතනයන් හි ඉතිහාසය, වර්තමාන කාර්යභාරය ළඟා කර ගත් ප්‍රගතිය හා අනාගත දිශානතිය පිළබඳ තොරතුරු ඇතුලත් කර "Labour wayforward" ග්‍රන්ථය ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව දේශීය/ විදේශීය වශයෙන් පැවැත්වෙන විශේෂ රැස්වීම් වලදී පරිශීලනය කිරීම සඳහා මෙම ග්‍රන්ථය භාවිතා කළ හැකි වේ.

12. අම්පාර ප්‍රදේශයේ ඉදිකරමින් පවතින සංචාරක නිවාසයේ ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇත. ඇස්තමේන්තුගත වටිනාකම රුපියල් මිලියන 25 කි.

13. ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය - 2017 වැඩසටහනට සමගාමීව අමාත්‍යාංශයේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් වෙනුවෙන් 2017.10.06 දින දේශීය ආහාර හා පෝෂණය සහ ගෙවතු වගා සංවර්ධනය යන මාතෘකා දෙක යටතේ දේශන 2 ක් පවත්වන ලදී. ඒසේම අමාත්‍යාංශ නිලධාරීන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් එළවළු බීජ වර්ග බෙදා දෙන ලදී.

## තිරසාර සංවර්ධන ඉලක්ක

2030 වර්ෂය වන විට තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීම තුළින් වඩාත් හොඳ සංවර්ධන මට්ටමක් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. තිරසාර සංවර්ධන අරමුණු අතුරින් 8 වන අරමුණ වන "තිරසර හා සංයුක්ත ආර්ථික වර්ධනය, සැමට පූර්ණ හා ඵලදායී රැකියා සහ සුනිසි රැකියා ප්‍රවර්ධනය" (Promote sustained inclusive and sustainable economic growth, full and productive employment and decent work for all) සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම අමාත්‍යාංශයේ දායකත්වය සැපයිය යුතු වේ. අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සහයෝගයෙන් ක්‍රියාත්මක කරන ලද "ශ්‍රී ලංකාවේ සුනිසි මෙහෙවර වැඩසටහන" 2013-2017 කාල පරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කරන ලද්දේ සැමට සුනිසි රැකියා සාක්ෂාත් කිරීම හා සමාජ කතිකාවත, සමාජ ආරක්ෂණය, ආදායම් උත්පාදනය සහ සුනිසි රැකියා සම්බන්ධ මූලික මූලධර්ම ප්‍රවර්ධනය අරමුණු කරගෙන වේ.

මේ යටතේ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ දායකත්වයෙන් ප්‍රධාන ව්‍යාපෘතීන් තුනක් ක්‍රියාත්මක විය.

(1) Skills for Local Economic Development
මෙම ව්‍යාපෘතිය මඟින් අම්පාර, මඩකලපුව, මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල ජනතාවට වෘත්තීය පුහුණු පහසුකම් ලබා දීම සහ මහජන රැකියා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සිදුකරන ලදී.

(2) ILO CLEAR Project (Country Level Engagement and Assistance / Cooperation to Reduce Child Labour in Sri Lanka)
ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා අවශ්‍ය වැඩ සටහන් මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරනු ලබයි. මේ යටතේ ගෘහ සේවයේ ළමයින් යෙදවීම පිළිබඳ නිර්දේශ ලබා දීම, කම්කරු පර්යේෂණ පද්ධති යෙදවුමක් හඳුන්වා දීම, ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් එළිදැක්වීම සහ ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම ආදී වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී

(3) LEED / EGLR Projects

ලංකාවේ උතුරු, උතුරු මැද පළාත් සහ අනෙකුත් පළාත් වල දුගී ජනතාව හා අවධානමට ලක්විය හැකි ජනතාව උදෙසා සුනිසි රැකියා ඇති කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. පළතුරු හා එළවළු වගාවන් සඳහා අගය දාම (Value chain) වර්ධනය, මත්ස්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම ආදී ක්‍රියාකාරකම් වර්ධනය, ග්‍රාමීය, ප්‍රාදේශීය, ජාතික හා අන්තර්ජාතික වශයෙන් හවුල් ව්‍යාපාර ඇති කිරීමට කටයුතු කරන ලදී.

එසේම කම්කරු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන සියලුම කටයුතු වලින් සැමට සුනිසි රැකියා සාක්ෂාත් කිරීම හා රටතුළ කාර්මික සාමයක් ඇති කිරීම පිණිස ක්‍රියාත්මක වේ.

ඒ අතරම අමාත්‍යාංශයට අනුබද්ධිත අනෙකුත් ආයතන විසින්ද වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ප්‍රවර්ධනය, කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සිදු කිරීම හා කම්කරු ප්‍රජාවගේ සුභ සාධනය නැංවීමට ක්‍රියා කිරීම තුලින් සැමට සුනිසි රැකියා සාක්ෂාත් කිරීමටත්, ඵලදායිතාව ඉහළ නැංවීමටත් සේව්‍ය සේවක සබඳතාව ශක්තිමත් කිරීම හා දැනුවත් ශ්‍රම බලකායක් ඇති කිරීම තුළින් රට තුළ කාර්මික සාමය ස්ථාපනයටත් අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

## කම්කරු සහ විදේශ සබඳතා අංශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කර ගැනීමට අදාලව කම්කරු, වෘත්තිය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් කටයුතු කිරීම කම්කරු හා විදේශ සබඳතා අංශය මගින් ඉටු කරනු ලබයි.

### අරමුණු

- ගෝලීයකරණය සහ විවෘත ආර්ථිකය තුළ නිරතුරු අභියෝගවලට ලක්වන සේවක ජනතාවගේ අයිතීන් සුරක්ෂිත කිරීම සහ සේව්‍ය - සේවක දෙපාර්ශවය අතර වඩා යහපත් සම්බන්ධතාවයක් ඇති කරලීම සඳහා කටයුතු කිරීම.
- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කම්කරු ප්‍රඥප්තීන්, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය නියමිත කාල වකවානුව තුල ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකාව කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය මත පදනම්ව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
- කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව පවතින ගැටළු විසඳීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම.
- අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතනවල නිලධාරීන් සඳහා විදේශ පුහුණුව ලබාදීමට ක්‍රියා කිරීම.
- නව නීති ඇති කිරීම හා පවත්නා කම්කරු නීති කාලයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ සහාය ලබාදීම.

**2017 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාර්යසාධනය**

1. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 22 යටතේ යැවිය යුතු වාර්තා සම්පාදනය කිරීම 2017 වර්ෂය සඳහා සම්මුතීන් 11 ක් සඳහා වාර්තා සම්පාදනය කිරීම සහ ව්‍යවස්ථා අංක 19 යටතේ යැවිය යුතු වාර්තාව සම්පාදනය කිරීම .
2. වාර්ෂිකව ජිනීවාහී පැවැත්වෙන ජාත්‍යන්තර කම්කරු සමුළුව සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජිතයන් සහභාගී කරවීමට අදාල සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම.
3. ත්‍රෛපාර්ශවීය නියෝජනයෙන් යුක්තව සෑම මසකම රැස්වන ජාතික කම්කරු උපදේශක සභාව (NLAC) රැස්වීමේදී පහසුකම් සපයන්නා ලෙසට ක්‍රියා කිරීම. සමාලෝචිත කාලය තුළ රැස්වීම් 07 ක් පවත්වා ඇත.
4. EU GSP+ සහනය ලබාගැනීම සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කිරීමේ වාර්තාව සම්පාදනය කිරීම සහ GSP+ බදු සහනය අධීක්ෂණය කිරීම සඳහා පත් කරනු ලැබූ ත්‍රෛපාර්ශවීය කමිටුවේ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ සියලු කටයුතු සංවිධානය කිරීම හා සහභාගි වීම.

5. ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP 2017-2021) ට අදාල ප්‍රගතිය සම්බන්ධ වාර්තා සම්පාදනය කිරීම.
6. විදේශීය ශිෂ්‍යත්ව, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයට අදාල අනෙකුත් ආයතන සහ කම්කරු දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් සහභාගී කිරීමට පියවර ගැනීම. 2017 ජනවාරි 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව තුළ නිලධාරීන් 50 ක් විදේශ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා සහභාගී වී ඇත.
7. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන කාලීන ආර්ථික සංවර්ධනයේ වැදගත් අංශ සහ ආර්ථික සංවර්ධනයේ ඉදිරි දැක්ම සම්බන්ධයෙන් වන වාර්තාවට අදාළ තොරතුරු සැපයීම සහ මහ බැංකු වාර්ෂික වාර්තාවට අදාළ තොරතුරු සම්පාදනය කිරීම.
8. කම්කරු නීති ප්‍රතිසංස්කරණය පිළිබඳ ත්‍රෛපාර්ශවීය කමිටු රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ සියලු කටයුතු සංවිධානය කිරීම.
9. ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර කම්කරු ක්ෂේත්‍රයට අදාලව සමාජ ආරක්ෂණ, අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියේදී ඇතිකර ගැනීමට නියමිත අවබෝධතා ගිවිසුම් හා ඒ සම්බන්ධ සියලු වැඩසටහන්වලට අදාල ව කටයුතු කිරීම
10. කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණපනත්, ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීම සහ නව පනත් ආරම්භ කිරීම පිළිබඳ කරුණු, ප්‍රවණතාවයන් හා අවශ්‍යතාවයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා විශේෂිත කමිටුවක් වන කම්කරු නීති හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අමාත්‍යාංශ කමිටු රැස්වීම් පැවැත්වීම.
11. ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රමය තුරන් කිරීමේ අරමුණින් සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය සිංහල, දමිළ හා ඉංග්‍රිසි භාෂා ත්‍රිත්වයෙන් එළි දැක්වීම හා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
12. ළමා ශ්‍රමය පිළිබඳ ජාතික ක්‍රියාකාරී කමිටුවට (NSCCL) අදාළ රැස්වීම් පැවැත්වීම හා ඊට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.
13. කම්කරු ක්ෂේත්‍රයට අදාළ ඇමරිකානු තානාපති කාර්යාලයෙන් විමසනු ලබන කරුණු සඳහා පිළිතුරු යැවීම.
14. විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් රජයේ අමාත්‍යාංශ වෙත කම්කරු ක්ෂේත්‍රයට අදාළ වන නව ප්‍රවණතා පිළිබඳ වර්තා සම්පාදනය කිරීම.
15. කම්කරු ක්ෂේත්‍රයේ සහයෝගීතාව ගොඩනැංවීම උදෙසා සිදු කරන ලද ශ්‍රී ලංකාවේ සහ විදේශීය නිල දූත සංචාර සම්බන්ධව කටයුතු කිරීම.
16. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගීතාවය ඇතිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හා වැඩමුළුවලට අදාළව සියලුම සම්බන්ධීකරණ කටයුතු කිරීම.
17. 2006 සමුද්‍රිය කම්කරු සම්මුතිය සහ 2003 අංක 185 දරණ මුහුදු යන්නන්ගේ අනන්‍යතා ලියවිලි පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් අපරානුමත කිරීම සඳහා අවශ්‍ය සියලුම කටයුතු සිදුකිරීම.

## සබරගමුව සංවර්ධන අංශය

කම්කරු හා වෘත්තීය සමිති විෂයට අමතරව සබරගමුව පළාත තුළ විශේෂ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා සම්බන්ධීකරණ විෂයන් 2017.06.09 දින සිට මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුලත් කර ඇති අතර එම කාර්යයන් කාර්යක්ෂමව සිදුකිරීම සඳහා "සබරගමුව සංවර්ධන කාර්යාලය" ස්ථාපනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත. එම අංශය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවාගෙන ඇත. එමෙන්ම 2018 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන මඟින් රුපියල් මිලියන 500ක් වෙන්කර ඇති අතර රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවල හදුනාගත් සංවර්ධන යෝජනා ප්‍රමුඛතාවය අනුව සිදු කිරීමට නියමිතව ඇත. ඒ අනුව සබරගමුව පළාත තුළ මෙතෙක් සිදුනොවූ සංවර්ධන කටයුතු ඇතුලත් කර 2017 - 2020 වර්ෂයන් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ සැලැස්මක් ද සකස් කර ඇත.

# 02

# කම්කරු දෙපාර්තමේන්තුව

1923 අංක 01 දරන ඉන්දියානු ආගමික කම්කරු ආඥා පනතට අනුව ආරම්භය සනිටුහන් වන කම්කරු දෙපාර්තමේන්තුව, මෙරට කම්කරු ප්‍රජාවගේ ප්‍රගමනය උදෙසා ක්‍රියාත්මක වන ප්‍රමුඛ ආයතනය වේ.

ශ්‍රී ලංකා ආර්ථිකයෙහි වැඩි දායකත්වයක් උසුලන පෞද්ගලික සහ අර්ධ රාජ්‍ය අංශයට අයත් ශ්‍රම බලකායේ වැටුප්, සේවා කොන්දේසි, රැකියා සුරක්ෂිතතාවය, සෞඛ්‍ය හා සුබසාධනය උදෙසා අදාල නීතිරීති සකස්කර ක්‍රියාවට නැංවීම සහ කාර්මික සාමය පවත්වා ගැනීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කරලීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වේ.

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව ප්‍රධාන අංශ 13ක් ක්‍රියාත්මකව පවතින අතර, දිවයින පුරා විසිරී සිටින කම්කරු ප්‍රජාවගේ අපේක්ෂිත සේවා පහසුකම් සපුරා ගැනීමට නීතිමය රැකවරණයත්, සුභසාධනයත් සැලසීමේ අදිටනින් කලාප කම්කරු කාර්යාල 11ක් ද, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40 ක් ද, උප කම්කරු කාර්යාල 17 ක් හා දිස්ත්‍රික් කර්මාන්ත ශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් ද කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරීම යටතේ, දිවයින පුරා පිහිටුවා ඇත. 2017 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලය 2495 කි.

**දැක්ම**

ජාත්‍යන්තර තරඟකාරී ආර්ථිකයක් සඳහා කාර්මික සාමය තහවුරු වූ රටක්


**මෙහෙවර**

කාර්මික සාමය තහවුරු වූ යහපත් වැඩ පරිසරයක් ස්ථාපිත කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම

**කාර්යභාරය**

- කම්කරු සුභසාධනය හා ප්‍රවර්ධනය උදෙසා සුසැදි අණපනත් ක්‍රියාවට නැංවීම සහ කාර්මික ආරවුල් සමථයකට පත් කිරීම.
- කම්කරු ප්‍රජාව පාදක කරගත් සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කම්කරු ක්ෂේත්‍රය පිළිබඳව සමීක්ෂණ පැවැත්වීම, කම්කරු ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට හා කම්කරු ප්‍රජාවගේ අභිවෘද්ධියට පාදක වන ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම් සකස් කිරීම, බාහිර හා අභ්‍යන්තර දැනුවත් කිරීමේ හා අධ්‍යාපනය ලබාදීමේ කටයුතු සිදු කිරීම.
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ පාර්ශවකරුවන් අතර සමාජ කතිකාවත ප්‍රවර්ධනය කිරීම.
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ සංඛ්‍යා ලේඛන රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ඉදිරිපත් කිරීම.
- වෘත්තීය සමිති සමග සබඳතා යහපත්ව හා සජීවී අයුරින් පවත්වාගෙන යාම.
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතයා වශයෙන් කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය සමග සහයෝගයෙන් හා සජීවී ආකාරයෙන් කටයුතු කිරීම.


# දෙපාර්තමේන්තුවේ සංවිධාන සැකැස්ම



## කම්කරු පරීක්ෂණ

ජාත්‍යන්තර තරඟකාරිත්වය හමුවේ දේශීය නිෂ්පාදන රැක ගනිමින් ජාතික ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා වැඩපොළ සහයෝගීතාවය සහ කාර්මික සාමය අත්‍යවශ්‍ය සාධකයන් වේ. ඒ සඳහා කම්කරු පරීක්ෂණ මගින් විශාල පිටිවහලක් ලැබේ. විධිමත් කම්කරු පරීක්ෂණ ක්‍රියාවලියක් තුළින් වැඩපොළ අනතුරු අවම කිරීමත්, නියමිත වැටුප් හා කොන්දේසි ක්‍රියාත්මක කිරීමත්, සේවකයන්ගේ විශ්‍රාමික දිවිය සඳහා සමාජ සංරක්ෂණය ඇති කිරීමත් කාර්මික සාමය ස්ථාපනය වීමත් සිදු වේ.

පහත ප්‍රස්ථාරය මගින් පසුගිය වසර 05ක කාලසීමාව තුළ කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දිවයින පුරා සිදුකරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව දක්වා ඇත. කම්කරු නිලධාරි පුරප්පාඩු රාශියක් පැවතීම හේතුවෙන් සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව මද පසුබෑමක් දැක්වුවද 2017 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී නවක කම්කරු නිලධාරීන් 179 දෙනෙකු සේවයට බඳවා ගන්නා ලද අතර ඔවුන්ගේ සේවය ඉදිරි වසරවලදී ඵලදායීව ප්‍රයෝජනයට ගැනීම තුළින් කම්කරු පරීක්ෂණ ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකවද ඉහළ නැංවීමට  අපේක්ෂා කෙරේ.




සටහන - 2017 වර්ෂයේ කම්කරු පරීක්ෂණ තොරතුරු දැනට ලැබී ඇති දත්ත අනුව සකස් කර ඇති බැවින් වෙනස්විය හැකිය

## විශේෂ විමර්ශන කටයුතු


සාමාන්‍ය පරිදි සිදු කෙරෙන කම්කරු පරීක්ෂණ සහ පැමිණිලි පරීක්ෂණවලට අමතරව කම්කරු අණ පනත් හා විධිවිධාන කඩිනමින් ක්‍රියාවට නැංවීම සඳහා හදිසි පරීක්ෂණ හා විශේෂ විමර්ශන රාජකාරී කටයුතු වල යෙදීම සඳහා දෙපාර්තමේන්තුවේ විශේෂ අංශයක් පිහිටුවා ඇත.

ඒ අනුව, 2017 වර්ෂයේදී පැමිණිලි පරීක්ෂණ 420 ක් සිදු කර ඇති අතර ගණනය කරන ලද හිඟ මුදල් වටිනාකම රු 198,184,397.89 ක් වේ.


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, මහජන පෙත්සම් කාරක සභාව, ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය ආදී ආයතන වෙතින් ලැබෙන පැමිණිලි පරීක්ෂණ 52ක් සිදුකර ඇත. සේවකයන් 100ට වැඩි ආයතන (තෝරාගත් අංශ සඳහා) 16 ක් පරීක්ෂා කර ඇත.

## කාර්මික ආරවුල් විසඳීම

කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් ක්‍රියාත්මක කළ විවිධ වැඩසටහන් මගින් 2017 වර්ෂයේදීද කම්කරු ආරවුල් ප්‍රමාණය අවම වීමට බලපා ඇති අතර, ඒ පිළිබඳව විමර්ශනය කිරීමේදී දෘශ්‍යමාන හේතු ලෙසට සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සහ කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් ජනමාධ්‍ය ඉවහල් කර ගනිමින් කරනු ලැබූ විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් වීම යන කරුණු බලපා ඇති බව පෙනී යයි.




සටහන - 2017 වර්ෂය සඳහා දැනට ලැබී ඇති දත්ත අනුව සකස් කර ඇති බැවින් මෙම දත්ත වෙනස්විය හැකිය




සටහන - 2017 වර්ෂය සඳහා දැනට ලැබී ඇති දත්ත අනුව සකස් කර ඇති බැවින් මෙම දත්ත වෙනස්විය හැකිය

## සාමූහික ගිවිසුම් ලියාපදිංචි කිරීම

සේවකයන්ට කම්කරු නීති රීතිවලින් ලබාදී ඇති අයිතිවාසිකම් සහ වරප්‍රසාදවලට වඩා වැඩි වරප්‍රසාද ලබා ගැනීමට සාමූහික ගිවිසුම් නිසා හැකි වේ. ඒ අනුව, 2017 වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 23කි.

## කාර්මික අධිකරණ කටයුතු

| | |
|---|---|
| අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම් සංඛ්‍යාව | 42 |
| ප්‍රදාන නිකුත් කිරීම් සංඛ්‍යාව | 48 |

## වෘත්තීය සමිති කටයුතු

2017 වර්ෂය තුළදී ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති/ සම්මේලන සංඛ්‍යාව 115ක් වන අතර අවලංගු කළ වෘත්තීය සමිති/ සම්මේලන සංඛ්‍යාව 85කි. ඒ අනුව 2017 වර්ෂය අවසන්වන විට ක්‍රියාත්මක සමස්ත වෘත්තීය සමිති/ සම්මේලන සංඛ්‍යාව 1815 කි.

## සේවය අවසන් කිරීමේ කටයුතු

අන්තනෝමතිකව හා අසාධාරණ ලෙස සේවය අවසන් කිරීම අවම කිරීම, පාරිසරික වෙනස්වීම්වල ප්‍රතිවිපාක ලෙස සේවය අහිමිවන සේවකයින් හට සාධාරණ හා යුක්ති සහගත අයුරින් සහන සැලසීම, ආර්ථික වර්ධනයත් සමඟ සිය ව්‍යාපාර ශක්තිමත් කිරීමට ගන්නා උපායමාර්ග වලදී අතිරික්ත සේවකයින් කඩිනමින් ඉවත් කිරීමට ව්‍යාපාරික ප්‍රජාවට සහන සැලසීම ආදී කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් 2017 වර්ෂය තුළ ලැබුනු පැමිණිලි සංඛ්‍යාව 116ක් වන අතර වර්ෂය තුළ විසඳූ සංඛ්‍යාව 68කි.

සේවය අවසන් කිරීම සම්බන්ධ ඉල්ලුම්පත් 36ක් ලැබී ඇති අතර සේවය අවසන් කිරීම සම්බන්ධ ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවසරදීම් 24ක් සිදුකර ඇත.

## වැඩ වර්ජන වාර්තා වීම්

අර්ධ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාව විසින් 2017 වර්ෂයේදී සිදු කරන ලද වැඩවර්ජන සංඛ්‍යාව 33 ක් ලෙස වාර්තා වී ඇත. එම වැඩවර්ජන උදෙසා සහභාගි වූ සේවක සංඛ්‍යාව 10,312 ක් වන අතර, එම වැඩ වර්ජන හේතු කොටගෙන අහිමි වූ මිනිස් දින ගණන 58,279 ක් වේ.

## නීති කටයුතු

කම්කරු නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේව්‍ය සේවක අයිතීන් සුරක්ෂිත කරමින් සේව්‍ය සේවක සහයෝගීතාවය වර්ධනය කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2017 වර්ෂය තුළ දිවයින පුරා කම්කරු කාර්යාලවල පවරන ලද නඩු පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| පනත | ගොනු කළ නඩු සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2017.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ පවරන ලද නඩු සංඛ්‍යාව | අවසන් නඩු සංඛ්‍යාව | නඩු මගින් අයකරගත් මුදල රු. | නඩු මගින් අයවිය යුතු මුදල රු. |
| පාරිතෝෂික පනත | 2,706 | 1,363 | 761 | 125,186,398,00 | 130,505,316.00 |
| කාර්මික ආරවුල් පනත | 253 | 40 | 8 | 1,275,836,00 | 136,650.00 |
| සේවය අවසන් කිරීමේ පනත | 9 | 13 | - | - | 23,767,677.45 |
| පඩි පාලක සභා ආඥා පනත | 547 | 115 | 22 | 2,337,852.00 | 7,346,025.93 |
| සාප්පු හා කාර්යාල පනත | 161 | 41 | 8 | 296,264.00 | 20,388,024.05 |
| කම්කරු විනිශ්චය සභා නියෝග | 449 | 62 | 16 | 2,699,358.00 | 35,181,727.68 |
| කාන්තා හා ළමා පනත | 14 | 6 | - | - | - |
| සේවක අර්ථසාධක අරමුදල් පනත | 9,013 | 2,343 | 2,159 | 2,141,840,039.00 | 2,066,196,116,45 |
| ප්‍රසූතිකාධාර පනත | 1 | 2 | - | - | - |
| අයවැය සහන දීමනා පනත | 31 | 23 | - | - | 2,500,695.60 |
| අනුමත අර්ථසාධක අරමුදල් | 0 | 4 | - | - | 865,000.00 |

2017 වර්ෂය තුළ අධිකරණවල ගොනු කළ නඩු පිළිබඳ තොරතුරු

| අධිකරණය | 2017.01.01 දිනට ශේෂය | ගොනු කළ නඩු සංඛ්‍යාව | අයවිය යුතු මුදල (රු.) | අවසන් නඩු සංඛ්‍යාව | අය කරගත් මුදල (රු.) |
|---|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 148 | 33 | - | - | - |
| අභියාචනාධිකරණය | 301 | 35 | - | - | - |
| මහාධිකරණය | 167 | 104 | - | 98 | - |
| දිසා අධිකරණය සහ වාණිජ මහාධිකරණය | 257 | 11 | 3,132,454,228.41 | 58 | 255,528,784.03 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 15,140 | 4,012 | 2,286,887,233.16 | 2,974 | 2,273,635,747.00 |


## සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ සේවක ප්‍රජාවගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත කිරීම සඳහා වන ආකර්ෂණීයම සමාජ ආරක්ෂණ ක්‍රමය වන සේවක අර්ථසාධක අරමුදල කම්කරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, 2017 වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි කරන ලද සේවායෝජකයින් සංඛ්‍යාව 7777කි.

## දායක මුදල් රැස් කිරීම

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් ආවරණය කරනු ලබන සියලුම සේවකයින් වෙනුවෙන් යම් මාසයක දායක මුදල් අදාල සේවා යෝජකයන් විසින් ඊළඟ මාසයේ අවසන් දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කළ යුතුය.

පසුගිය වසර 5ක කාල සීමාව තුළ දායක මුදල් රැස් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.




සටහන - 2017 වර්ෂය තුල දායක මුදල් රැස් කිරීමේ ප්‍රගතියෙහි සඳහන් වන්නේ 2017.09.30 දිනට ඇස්තමේන්තුගත තොරතුරු වේ.

| සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගතිය | 2017.12.31. දිනට |
|---|---|
| සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව | 17,131,226 * |
| මුළු සේවායෝජක සංඛ්‍යාව | 223,114 * |
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 1,987,753 |
| සක්‍රිය සාමාජික සංඛ්‍යාව (මිලියන) | 2.29 ** |
| සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව | 72,964 ** |

* 2016.12.31 දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු වේ.
** 2017.09.30 දිනට ඇස්තමේන්තුගත තොරතුරු වේ.

| | | 2017.12.31 දිනට |
|---|---|---|
| නව ලියාපදිංචි කිරීම් | සාමාජිකයන් | 490,847 ** |
| | සේවායෝජකයන් | 4,804 ** |
| ප්‍රතිලාභ ගෙවීම් | ගෙවූ ප්‍රතිලාභ මුදල ( රු. මිලියන) | 91,093 ** |
| දායක මුදල් රැස් කිරීම (රු. මිලියන) | | 98,834 ** |
| සේ.අ.අ. නිවාස ණය | අනුමත කළ අයදුම්පත් සංඛ්‍යාව | 8,135 ** |
| | අනුමත කළ ණය මුදල් වටිනාකම ( රු මිලියන) | 3,562 ** |

** 2017.09.30 දිනට ඇස්තමේන්තුගත තොරතුරු වේ.

2017 වර්ෂය තුළ සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව

| ප්‍රතිලාභය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|
| විශ්‍රාම වයසට එළඹී සේවයෙන් ඉවත්වූ පසු සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම | 87,268 |
| විවාහ හේතුමත සේවයෙන් ඉවත් වූ කාන්තා සාමාජිකාවන්ට ප්‍රතිලාභ ගෙවීම | 22,426 |
| පූර්ණ දුබලතාවයට පත්වීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 1,048 |
| මියගිය සාමාජික ප්‍රතිලාභ | 4,738 |
| 30% විශ්‍රාම පූර්ව ප්‍රතිලාභ | 33,014 |
| විදේශ රටක ස්ථිර පදිංචියට යෑම නිසා ප්‍රතිලාභ ගෙවීම | 1,959 |
| රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලැබීම නිසා සේවයෙන් ඉවත්වීම හේතුවෙන් ප්‍රතිලාභ ගෙවීම | 13,488 |
| රාජ්‍ය සංස්ථාවක්/ මණ්ඩලයක් වසා දැමීම, වියදම් අඩුකිරීමට සේවකයන් ඉවත්කිරීම හෝ සමාගමක් බවට පරිවර්තනය කිරීම හේතුවෙන් සේවය හැරගිය සේවකයන්ට ප්‍රතිලාභ ගෙවීම | 2,785 |

2017.01.01 දින සිට 2017.12.31 දක්වා ක්‍රියාකාරකම්හි මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහන/ ක්‍රියාකාරකම | 2017 වසර සඳහා ඉලක්ක | | 2017.01.01 දින සිට 2017.12.31 දින දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | භෞතික | මූල්‍ය රු | භෞතික | මූල්‍ය රු |
| නව සේවා යෝජකයින් ලියාපදිංචි කිරීම | 8,000 | - | 7,718 | - |
| වෙළඳ දැන්වීම් නිර්මාණය | 1 | 1,000,000 | 1 | 1,552,500 |
| වෙළඳ දැන්වීම් ප්‍රචාරණය - රූපවාහිනී නාලිකා | 100% | 8,000,000 | 45% | - |
| වෙළඳ දැන්වීම් ප්‍රචාරණය - ගුවන් විදුලි නාලිකා | 100% | 4,000,000 | 100% | 2,399,130 |
| ඇඟිලි සළකුණු ව්‍යාපෘතිය සඳහා උපකරණ මිලදී ගැනීම | 100% | 16,000,000 | 100% | 16,500,000 |
| සාමාජිකයින් 100,000කගේ ඇඟිලි සළකුණු ලබා ගැනීම (Out source) | 100,000 | 17,000,000 | - | - |
| ඇඟිලි සළකුණු ලබා ගැනීම - දෙපාර්තමේන්තු නිලධාරීන් | 50,000 | - | 12,600 | - |
| පළමු නිවේදන යැවීම | 11,000 | - | 10,888 | - |
| පළමු නිවේදන යැවීම මගින් අපේක්ෂිත මුදල (රු. මි) | 6,000 | - | 6,263 | - |
| අවසාන නිවේදන යැවීම | 7,500 | - | 6,613 | - |
| අවසාන නිවේදන යැවීම මගින් අපේක්ෂිත මුදල (රු. මි) | 5,000 | - | 4,048 | - |
| කම්. කො. ගිණුමේ නිරවුල් කිරීමට අපේක්ෂිත මුදල (රු. මි) | 4,000 | - | 9,529 | - |
| පොදු තැන්පත් ගිණුම නිරවුල් කිරීමට අපේක්ෂිත මුදල (රු. මි) | 800 | - | 1,118 | - |
| පෞද්ගලික අර්ථසාධක අරමුදල පිළිබඳ පැවැත්වීමට අපේක්ෂිත විමර්ශන ගණන | 80 | - | 82 | - |

## සමාජ කතිකාවත

සමාජ කොටස්කරුවන් අතර සන්නිවේදනය, අදහස් විමසීම හා එක්ව තීරණ ගැනීම ප්‍රචලිත කිරීම සඳහා ඔවුන් අතර කතිකාව සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම තුළින් කාර්මික සාමය හා සංහිඳියාව පවත්වාගෙන යාමෙන් ආර්ථික සමෘද්ධිය උදාකර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව කැපවී සිටී.

ඒ අනුව, සමාජ කතිකාවත ප්‍රවර්ධනය උදෙසා 2017 වර්ෂයේදී සිදුකරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

| | වැඩසටහන / ක්‍රියාකාරකම | 2017 වසර සඳහා වූ ඉලක්ක | | අමතර ප්‍රතිපාදන ලැබීම් (සංශෝධන) | | 2017.01.01 දින සිට 2017.12.31 දක්වා භෞතික හා මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය | භෞතික | මූල්‍ය |
| 1 | සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන් | 139 | 1,475,000.00 | 139 | 1,557,945.00 | 128 | 1,442,419.00 |
| 2 | කලාප හා දිස්ත්‍රික් උපදේශන සභා | 51 | 688,500.00 | 51 | 688,500.00 | 48 | 561,304.00 |
| 3 | කතිකාව සඟරාව | 1 | 40,000.00 | 1 | 40,000.00 | 1 | 25,500.00 |
| 4 | සමාජ කතිකා විශිෂ්ඨතා තරඟාවලිය | 100% | 796,500.00 | 100% | 1,213,555.00 | 100% | 1,005,224.59 |

| වැඩසටහන | 2017 වර්ෂයේ පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීත්වය |
|---|---|---|
| ආයතන වැඩමුළු | 60 | 2,648 |
| කළමනාකරුවන් හා සේවකයන් සඳහා | 10 | 407 |
| අර්ධ රාජ්‍ය අංශය සඳහා | 12 | 545 |
| කලාප උපදේශන සභා | 8 | 277 |
| දිස්ත්‍රික් කාර්යාල උපදේශන සභා | 40 | 1,333 |
| දිස්ත්‍රික් කාර්යාල ආයතන | 32 | 1,155 |
| උප කම්කරු කාර්යාල ආයතන | 14 | 469 |

සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා සංකල්පය ප්‍රවර්ධනය සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩ සටහන්වල පසුවිපරම් හා ඇගයීම් ක්‍රියාවලියක් ලෙස සමාජ කතිකා හා වැඩපොල සහයෝගිතා දීප ව්‍යාප්ත තරඟාවලිය සංවිධානය කොට පැවැත්වීම ද කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සිදු කරනු ලබන අතර 2017 වර්ෂයේදී ද එම තරඟාවලිය සාර්ථකව පවත්වා ජයග්‍රාහකයන් වෙත සම්මාන පිරිනමන ලදී. සමාජ කතිකා හා වැඩපොල සහයෝගිතා සංකල්පය ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මක ආයතන ඇගයීම හා සේවක සේවිකාවන්ගේ නිර්මාණ කුසලතා ඇගයීම සඳහා ආයතන මට්ටමින් පැවැත්වෙන දීප ව්‍යාප්ත සමාජ කතිකා විශිෂ්ඨතා සම්මාන තරඟාවලිය සහ ආයතනයන්හි සේවක/සේවිකාවන්ගේ නිර්මාණ තරඟාවලිය යන දෙඅංශයෙන් මෙම තරඟාවලිය පවත්වන ලදී.

## කර්මාන්තමය සුරක්ෂිතතාවය සහ වෘත්තීය ස්වස්ථතාවය


අනතුරු සහ උපද්‍රවයන්ගෙන් තොර සහ සෞඛ්‍යාරක්ෂිත සේවා පරිසරයක් සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ නැංවීමට ඉවහල්වන අතර නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවන්ගේ ගුණාත්මකභාවය උසස් කිරීමට ද හේතුවේ. ඒ අනුව, සේවා ස්ථානවල ඇතිවන ආපදා, අනතුරු සහ වෘත්තීමය රෝගාබාධ අවම කිරීම උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව ක්‍රියා කරනු ලැබේ.

2017 වර්ෂය තුළදී කර්මාන්තශාලා අනතුරු පරීක්ෂණ සහ පැමිණිලි විමර්ශණ 4943ක් සිදුකර ඇති අතර අධි

අන්තරාදායක යන්ත්‍ර සූත්‍ර පරීක්ෂණ 7,530ක් සිදුකර ඇත. 2017 වර්ෂය තුළ වාර්තාවී ඇති මරණීය අනතුරු 68ක සංඛ්‍යාව සහ මරණීය නොවන අනතුරු 1,451ක සංඛ්‍යාව විමර්ශනය කිරීමේ කටයුතුද සිදුකර ඇත. සෑම වසරකම අප්‍රේල් 28 දිනට යෙදෙන ලෝක සුරක්ෂිතතා දිනය සැමරීම සඳහා 2017 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුව විසින් අවිස්සාවේල්ල ආයෝජන ප්‍රවර්ධන කලාපයෙහි ජාතික මට්ටමින් වැඩසටහනක් පවත්වන ලදි.

වෘත්තීය සුරක්ෂිතතා සතිය නිමිතිකර පවත්වනු ලබන වැඩසටහන 2017 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී කොළඹ ගලධාරි හෝටලයේදී පවත්වන ලදී.

කර්මාන්තමය සුරක්ෂිතතාවය උදෙසා සිදුකළ කර්මාන්තශාලා නව ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව පහත වගුවෙන් දැක්වෙන අතර 2017.12.31 දිනට ලියාපදිංචි කරන ලද මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව 28,854 කි.




වෘත්තීමය රෝගාබාධ ඇතිවිය හැකි සේවා වටපිටාවන් පරීක්ෂා කිරීම සඳහා පාරිසරික මිනුම් 45ක් සිදුකර ඇති අතර සේවකයන් වෙත වෘත්තීය රෝගාබාධ හෝ රෝග ලක්ෂණයන් පවතීදැයි මූලික අවධියේදී හඳුනා ගැනීම උදෙසා සිදු කරන ලද ජීව විද්‍යාත්මක පරීක්ෂණ සංඛ්‍යාව 1,235 කි. වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් 271 ක් සිදුකර ඇත.

කර්මාන්තමය සුරක්ෂිතතාවය සහ වෘත්තීය ස්වස්ථතාවය ප්‍රවර්ධනය උදෙසා 2017 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව 399 කි.

## ශ්‍රම ප්‍රමිති

පෞද්ගලික අංශයේ සේවා නියුක්ත වූවන්ගේ රැකියා සුරක්ෂිතතාවය සහ සුභසාධනය කෙරෙහි බලපාන සේවා තත්ත්වයන් හා සේවා කොන්දේසි පිළිබඳව ප්‍රමිතීන් සැකසීම හා ඒවාට නෛතික තත්ත්වයන් ලබා දීමට කටයුතු කිරීම හා අධීක්ෂණය කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයකි. ඒ අනුව, 2017 වර්ෂයේදී පහත කාර්යයන් සිදුකර ඇත.

- මල්, විසිතුරු පැළ, එළවළු හා පළතුරු වගා කිරීමේ සහ අපනයනය කිරීමේ කර්මාන්තය සඳහා අවම වේතන ප්‍රසිද්ධ කිරීම
- නිල කාලය අවසන් පඩි පාලක සභා 13 ක් සඳහා නියෝජිතයන් පත් කිරීම
- කොකෝවා, කරඳමුංගු හා ගම්මිරිස් වැවීමේ හා සෑදීමේ කර්මාන්තයේ මාසික වැටුප් ප්‍රසිද්ධ කිරීම
- දින පහේ සතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම් 200 ක් සිදු කිරීම
- සාමූහික ගිවිසුම් සඳහා නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම් 33 ක් සිදු කිරීම
- තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තයේ ආඥාව නැවත සකස් කිරීම හා ප්‍රසිද්ධ කිරීම
- සේව්‍ය සේවක දෙපාර්ශවය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

## සේවයේ නියුතු කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ විශේෂ දායකත්වයක් කාන්තා සේවා නියුක්තිය විසින් ඉටු කරනු ලබන අතර එම වැඩකරන කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් හා ආරක්ෂාව මෙන්ම ඔවුන්ගේ සෞඛ්‍ය හා සුභ සාධන පහසුකම් සැලසීම පිළිබඳව සොයා බැලීම මෙන්ම ජාතියේ ජීවය බඳු ළමා පරපුරෙහි සුරක්ෂිතතාවය තහවුරු කිරීම උදෙසා ළමා ශ්‍රමය පිටුදැකීමේ කාර්යය උදෙසා ක්‍රියා කිරීමද කම්කරු දෙපාර්තමේන්තුව සතු වගකීමකි.

ඒ අනුව, 2017 වර්ෂය තුළ කම්කරු දෙපාර්තමේන්තුව පහත ක්‍රියාකාරකම් සිදුකර ඇත.

| වැඩසටහන | 2017 වර්ෂය සඳහා සැලසුම් කළ වැඩසටහන් | 2017.12.31 දිනට භෞතික ප්‍රගතිය | 2017.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය රු. |
|---|---|---|---|
| **දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ සිදු කරන ලද වැඩසටහන්** | | | |
| ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම | 01 | 100% | 448,529.00 |
| වැඩිලි වැඩසටහන් පැවැත්වීම | 03 | 03 | 89,550.00 |
| සේවාස්ථ වැඩසටහන් පැවැත්වීම | 13 | 09 | 34,600.00 |
| මනෝවිද්‍යා උපදේශන වැඩසටහන් පැවැත්වීම | 03 | 02 | 36,500.00 |
| රාත්‍රී පරීක්ෂණ පැවැත්වීම | 70 | 61 | 176,280.00 |
| කාන්තා පැමිණිලි | - | 09 | - |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම | 12 | 08 | 29,300.00 |
| ළමා පැමිණිලි | - | 87 | - |
| **සුනිසි මෙහෙවර වැය ශීර්ෂය යටතේ සිදු කරන ලද වැඩසටහන්** | | | |
| ස්වයං රැකියා වැඩසටහන් පැවැත්වීම | 04 | 04 | 181,820.00 |
| දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම | 18 | 18 | 31,000.00 |
| සමාජ රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා සායන පැවැත්වීම | 04 | 03 | 76,100,00 |
| පාසැල් හැරයාමේ අවධානම් සහිත පාසැල්වල දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 46 | 29 | 31,450.00 |
| ලෝක ළමා ශ්‍රම විරෝධී දිනය පැවැත්වීම | 01 | 100% | 229,500.00 |
| අනතුරුදායක ළමා ශ්‍රමය සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණ පැවැත්වීම | 52 | 46 | 141,950.00 |
| ළමා ශ්‍රමය සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 2 | 2 | 100,400.00 |

මෙම වර්ෂයේදී ලෝක ළමා ශ්‍රම විරෝධී දින වෙනුවෙන් සැමරුම් උත්සවයක් සංවිධානය නොකළ අතර, එම දිනයට සමගාමීව අඩු අදායම්ලාභී පවුල්වල අනතුරුදායක රැකියාවල නිරතවීමේ අවදානම සහිත පාසල් දරුවන් හට ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිටු දැකීම පිළිබඳ පණිවුඩය මුද්‍රණය කරන ලද පාසල් අභ්‍යාස පොත් බෙදා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

2017 ඔක්තෝබර් මස 01 වන දිනට යෙදෙන ලෝක ළමා දිනය සැමරීම වෙනුවෙන් වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් 10 ක ළමුන් 50 දෙනෙකු සහභාගී කරගනිමින් දැනුම මිනුම, ගායන තරඟ, අභියෝගතා තරඟ, සහය දිවීමේ තරඟ ආදිය පවත්වා ජයග්‍රාහී දරු දැරියන්ට තිළිණ හා සහතිකපත් ප්‍රදානය කිරීමද, සහභාගී වූ සියලු පාසල් ළමුන් සඳහා ත්‍යාග ප්‍රදානය කිරීමද සිදු කරන ලදී.

## පරිපාලන කටයුතු

### භෞතික සම්පත් පරිපාලනය

කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට කාර්යක්ෂම ලෙස රාජකාරි කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ යටිතල පහසුකම් ක්‍රමවත් ලෙස සකස් කිරීම අත්‍යාවශ්‍ය සාධකයක් වේ.

ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව සතු භූමියෙහි 'මෙහෙවර පියස' ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු වෙමින් පවතී. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වෙනුවෙන් 2017 වර්ෂය තුළ දැරූ වියදම රු. මිලියන 2133.75 කි. 2017.12.31 දිනට එහි භෞතික ප්‍රගතිය 67.92% කි.

අවිස්සාවේල්ල සහ මීගමුව කම්කරු කාර්යාලවල ඉදිකිරීම් කටයුතු වර්ෂය තුළදී නිම කර ඇත. කම්කරු කාර්යාලවල සිදු කෙරෙන ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය පහත පරිදි වේ.

| වැඩසටහන/ ක්‍රියාකාරකම | 2017 වසර සඳහා වූ ඉලක්ක | | 2017.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | භෞතික | මූල්‍ය (රු. මිලියන) | භෞතික | මූල්‍ය (රු. මිලියන) |
| මෙහෙවර පියස | 80% | 3200 | 67.92% | 2133,80 |
| පොළොන්නරුව | අදියර 03 - 100% | 25 | අදියර 03 - 100% | 0 |
| කුරුණෑගල | අදියර 02 - 100% | 61 | අදියර 02 - 30% | 61 |
| පුත්තලම | අදියර 03 - 75% | 15 | අදියර 03 - 98% | 15 |
| අම්බලන්ගොඩ | අදියර 02 - 35% | 21 | අදියර 02 - 20% | 21 |
| අනුරාධපුර | අදියර 02 - 100% | 4 | අදියර 02 - 100% | 3.447 |
| මහියංගනය | අදියර 02 - 5% | 21 | අදියර 02 - 50% | 21 |
| රත්නපුර | අදියර 01 - 75% | 25 | 3% | 24.99 |
| බදුල්ල | අදියර 01 - 75% | 25 | 2% | 24.79 |
| හැටන් | අදියර 01 - 75% | 15 | 2% | 14.98 |
| නාඋල | අදියර 01 - 75% | 15 | 2% | 0.014 |
| වව්නියාව | අදියර 01 - 75% | 15 | 2% | 0.023 |

### මානව සම්පත් කළමනාකරණය

කාර්ය මණ්ඩලය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම තුළින් දෙපාර්තමේන්තුවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම පහසු වේ. ඒ සඳහා ඉටු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- තාක්ෂණික සේවයේ බඳවා ගැනීමේ පටිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීම
- විද්‍යාත්මක සේවයේ පර්යේෂණ නිලධාරී බඳවා ගැනීම් පටිපාටිය සදහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කිරීම
- කම්කරු කොමසාරිස් (වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය) බඳවා ගැනීමේ පටිපාටිය සදහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම
- නීති නිලධාරී, කම්කරු නිලධාරී, ලඝුලේඛක, රියදුරු සහ කාර්යාල සේවක සේවයේ (කා.සේ.සේ.) තනතුරුවල පුරප්පාඩු සදහා බඳවා ගැනීමට අදාල කටයුතු සිදු කිරීම
- මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යසාධන ගෙන්වා ගැනීම. (1A,1B,2,3,17)
- නිල ඇඳුම් දීමනා ලබා දීම (මුරකරු සේවය, රියදුරු, කා.කා.සේ. අදාල සේවකයින් හට)
- වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම.
- විශ්‍රාම වැටුප් ගොනු සකස් කිරීම.
- සහකාර කම්කරු කොමසාරිස්වරු, ඉංජිනේරු සේවය, කම්කරු නිලධාරීන්, මානව සම්පත් සංවර්ධන නිලධාරීන්, රියදුරන් සහ කාර්යාල සේවක සේවය (කා.සේ.සේ.) සදහා කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම.
- මානව හිමිකම් කොමිෂන් සභාව, මහජන පෙත්සම් කාරක සභාව වෙත වාර්තා යැවීම.
- වසර මැද කාර්ය සාධන (වාර්ෂික) ගෙන්වා ගැනීම.
- වත්කම් බැරකම් වාර්තා ගෙන්වා ගැනීම.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව වැටුප් පරිවර්තනය කිරීම
- දෙපාර්තමේන්තු ප්‍රතිව්‍යුහගතකරණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාල මූලික කටයුතු සිදු කිරීම

## පුස්තකාලය හා තොරතුරු සේවාව

සේව්‍ය සේවක ප්‍රජාවගේ අභිවර්ධනයට අදාලව හඳුනාගත් අවශ්‍යතාවයන් හා ගැලපෙන පරිදි විෂයානුබද්ධ තොරතුරු රැස්කිරීමටත්, අවශ්‍යතා අනුව එම දැනුම විස්තීරණය කිරීමට මග පෑදීමටත්, දෙපාර්තමේන්තුවේ සේවකයන්ට සහ පොදු මහජනතාවට කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීමටත් කම්කරු දෙපාර්තමේන්තුව විසින් පුස්තකාලයක් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, පාඨකයන්ගේ දැනුම, අවබෝධය සහ රසාස්වාදය උදෙසා පොත් හා සඟරා 173 ක් වර්ෂය තුලදී අලුතින් මිලදී ගැනීමට කටයුතු කර ඇත.

එසේම කම්කරු දෙපාර්තමේන්තුව විසින් කම්කරු කෞතුකාගාරයක් පවත්වාගෙන යනු ලබන අතර එහි ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රයේ ආරම්භයේ සිට විකාශය වූ අයුරු ප්‍රදර්ශනය කිරීමත් කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින පැරණි අණ පනත් හා කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින ලේඛනයන් සංරක්ෂණය කිරීමත් සිදු කරනු ලැබේ.

## ප්‍රගති අධීක්ෂණ සහ සමාලෝචන කටයුතු

කම්කරු කාර්යාලවල ප්‍රගතිය අධීක්ෂණය කර ප්‍රගති සමාලෝචන කටයුතු සඳහා 2017 වසරේදී කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 06 ක් පවත්වා ඇත. එසේම ප්‍රාදේශිය කාර්යාල භාර නිලධාරීන්ගේ සම්මන්ත්‍රණ 03 ක් පවත්වා ඇත.

කම්කරු නිලධාරීන් විසින් සිදු කරනු ලබන කම්කරු පරීක්ෂණ පිළිබඳ තොරතුරු සහ කාර්යාල වලට ලැබෙන පැමිණිලි, නඩු පිළිබඳ තොරතුරු පරිගණක ගත කිරීම මගින් විධිමත් දත්ත පද්ධතියක් ඇති කිරීම සඳහා Labour Inspection System Application හෙවත් LISA වැඩසටහන යාවත්කාලීනව පවත්වාගෙන යාමද මෙම වර්ෂයේදී සිදුකර ඇත. දිස්ත්‍රික් කාර්යාලයන්හි LISA වැඩසටහන භාවිතාකර රාජකාරි සිදුකරන ආකාරය පරීක්ෂාකර අන්තර්ජාල ගැටළු හා පරිගණක දෝෂ විසඳීම, LISA වැඩසටහන සම්බන්ධ විෂය ගැටළු විසඳීම, පෙත්සම් ලේඛනය සම්බන්ධයෙන් සහ නඩු ලේඛනය පවත්වා ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමද සිදුකර ඇත.

නිලධාරීන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කර පවත්වා ඇත.

| වැඩසටහන | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| මාණ්ඩලික නිලධාරි පුහුණු වැඩසටහන් | 6 |
| කළමණාකරන සහකාර නිලධාරි පුහුණු වැඩසටහන් | 18 |
| පරිගණක පුහුණු වැඩසටහන් | 14 |
| පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලා සඳහා යොමු කිරීම් | 80 |
| බාහිර පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම් | 24 |
| වෙනත් පුහුණු වැඩසටහන් | 5 |
| විදේශ පුහුණු වැඩසටහන් | 6 |

## මූල්‍ය කළමනාකරණය

2017 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවට සිය මූල්‍ය සම්පත් කාර්යක්ෂමව, ඵලදායීව හා පිරිමැසුම්දායීව මෙහෙයවීමට හැකියාව ලැබී ඇත.

මූල්‍ය කළමනාකරණය උදෙසා පහත කටයුතු සිදුකරන ලදී.

- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම හා එය ක්‍රියාත්මක කිරීම
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් ලබා ගන්නා ලද භාණ්ඩ හා සේවා නිසි පරිදි බෙදාහැරීම
- උප කාර්යාල සඳහා අග්‍රිම නිකුත් කිරීම හා එම කාර්යාලවල මූල්‍ය අධීක්ෂණය
- මාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම හා අදාල පාර්ශවයන් වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම
- බාහිර පාර්ශවයන්ගෙන් ලැබෙන සියලුම ලැබීම් හා ගෙවීම් කටයුතු නීතිරීති ප්‍රකාරව මෙහෙයවීම

- දෙපාර්තමෙන්තුව සතු ප්‍රාග්ධන වත්කම් සමීක්ෂණය හා අපහරණ කටයුතු
- දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ පඩිනඩි, ණය අත්තිකාරම් හා දිමනා ගෙවීම

2017 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහන | වියදම් වර්ගය | 2017 වර්ෂය සඳහා ප්‍රතිපාදනය (රු) | 2017 දෙසැම්බර් 31 දිනට වියදම (රු) |
|---|---|---|---|
| 221 | පුනරාවර්තන | 1,505,256,000.00 | 1,451,795,889.23 |
| | මූලධන | 3,607,300,000.00 | 2,503,986,516.61 |

## කම්කරු ක්ෂේත්‍රයට සම්බන්ධ සංඛ්‍යාලේඛන ප්‍රකාශන කටයුතු

ශ්‍රී ලංකාවේ කම්කරු අංශයේ කාලීන සංකීර්ණ වෙනස්වීම් අධ්‍යයනය කරමින් වඩා නිවැරදි තොරතුරු හා සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා ඒ තුළින් අනාගත පුරෝකථන ඉදිරිපත් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු කරනු ලැබේ.

2017 ජනවාරි මස 01 සිට 2017 දෙසැම්බර් 31 දක්වා භෞතික සහ මූල්‍ය ප්‍රගතිය.

| වැඩසටහන/ ක්‍රියාකාරකම | 2017.01.01 දින සිට 2017.12.31 දක්වා ප්‍රගතිය | |
|---|---|---|
| | භෞතික | මූල්‍ය (රු.) |
| වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණ වාර්තාව 2016 | මුද්‍රණයෙන් සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කර ඇත | 76,500.00 |
| වාර්ෂික රැකිරක්ෂා සමීක්ෂණය 2017 | 2017 සමීක්ෂණයේ දත්ත පරිගණක ගත කිරීම සිදුකරමින් පවතී | 159,380.00 |
| කම්කරු සංඛ්‍යාති වාර්ෂික ප්‍රකාශනය 2016 | මුද්‍රණයෙන් සහ වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීම සඳහා පිටපත සකස් කර ඇත | - |
| ශ්‍රී ලංකා සේවක සගරාව කාර්තුමය ප්‍රකාශනය 2017 | ප්‍රකාශනය සඳහා වෙනත් ආයතන වලින් දත්ත එක්රැස් කර ලබා දී ඇත | 3,500.00 |
| සාමාන්‍ය ඉපැයීම් සහ වැඩකළ පැය ගණන පිළිබඳ සමීක්ෂණ වාර්තාව 2016 | අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කර ඇත | 2,800.00 |
| සාමාන්‍ය ඉපැයීම් සහ වැඩකළ පැය ගණන පිළිබද සමීක්ෂණය 2017 | 2017 මාර්තු සමීක්ෂණය අවසන් කර ඇත සැප්තැම්බර් සමීක්ෂණය අවසන් කර දත්ත සංස්කරණය කරමින් පවතී | 48,300.00 |
| අවම වැටුප් අනුපාත දර්ශකාංකය ගණනය කිරීම | අදාල කාලය සඳහා පඩි පාලක සහා අනුව මාසික අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම ඔක්තෝම්බර් මාසය දක්වා අවසන් කර ඇත | - |
| සේවක අර්ථසාධක අරමුදල් නව ලියාපදිංචි කිරීම් පරිගණක ගත කිරීම | මේ වනවිට ලැබී ඇති දත්ත පරිගණක ගත කර ඇත | - |

## තොරතුරු තාක්ෂණික කටයුතු

ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අදාල මූලික කටයුතු 2017 වර්ෂයේදී ආරම්භ කර ඇත. එසේම දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා සැපයෙන මහජන සේවාවන් ප්‍රවර්ධනය කිරීමටද කටයුතු කර ඇත.

03

# මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

## රාජකාරී ඉටු කිරීමේ විෂය පථය

මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යන් ඉටු කරලීමට බලාපොරොත්තු වේ.

- ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු
- වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු
- ශ්‍රම වෙළඳපල තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම
- රැකියා පියස (Jobs Net) මගින් සිදු කෙරෙන වෙනත් සේවාවන්

සහ ඉහත විෂයන්ට ආනුෂාංගික සහ සම්බන්ධිත සෙසු සියලු කටයුතු.

## උපාය මාර්ගික දිශානතිය

**දැක්ම**

ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

පුළුල් නිපුණතාවයෙන් යුත්, ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ අපේ මානව සම්පත්වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම

## දීර්ඝ කාලීන ඉලක්ක

1. ගෝලීය වශයෙන් තරඟකාරී, නිපුණතාවයෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ගොඩ නැංවීම
2. විරැකියාව අවම කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
3. සංවිධිත පරිපූර්ණ ශ්‍රම වෙළඳපල තොරතුරු පද්ධතියක් ඇති කිරීම

## දෙපාර්තමේන්තුවේ අරමුණු

ඉහත ඉලක්කයන් ඉටුකරගැනීම බලපැවැත්වන්නේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම තුළිනි.

1. ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
2. කුසලතා නොගැලපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටළුව විසඳීම
3. වර්තමාන ශ්‍රම බලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
4. මිනිස්බල සැලසුම් කිරීම සහ සංවර්ධනය හා පුරෝකථනය.
5. අවිධිමත් අංශය සංවර්ධනය
6. පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂකයින් පෙළඹවීම
7. නිදහස් රාජ්‍ය රැකියා සේවය ලබාදීම
8. අවධානමට ලක් වු කණ්ඩායම්, ආබාධිත පුද්ගලයන් හා ඌණ සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා මිනිස්බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම
9. ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියලුම ශ්‍රී ලාංකිකයන්ට ලබා දීම
10. දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ නැඹියාවන් පුරෝකථනය

මේ අයුරින් විරැකියාව අවම කිරීම හා යහපත් රැකියා ඇති කිරීම යන සද්කාරයයන් ඉටුකර ගැනීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව සිය මානව සම්පත් උපයෝගී කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

### දෙපාර්තමේන්තුවේ අංශ

- පාලන, සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් අංශය
- ගිණුම් අංශය
- මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය
- රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

### 2017 දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රගතිය (අවසාන භාණ්ඩාගාර සැසඳුම් වාර්තාවට පෙර)

| | ප්‍රතිපාදනය (රු.000) | වියදම (රු.000) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 356,195 | 347,125 | 97.45% |
| ප්‍රාග්ධන වියදම් | 37,400 | 31,135 | 83.25% |
| එකතුව | 393,595 | 378,261 | 96.10% |

### 2018 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන

| | පුනරාවර්තන (රු.000) | ප්‍රාග්ධන (රු.000) | එකතුව (රු.000) |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් | 348,950 | - | 348,950 |
| සංවර්ධන ක්‍රියාකාරකම් | - | 31,100 | 31,100 |
| එකතුව | 348,950 | 31,100 | 380,050 |

### රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින හා නව්‍ය ලෙස රැකියා වෙළඳපල වෙත ප්‍රවේශ වන හා අනාගතයේ ප්‍රවේශ වීමට නියමිත ජනතාව වෙත සේවා නියුක්ති ආශ්‍රිත පහසුකම් සැපයීමේ අරමුණින් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් පවත්වනු ලබයි.

**රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු**

**රැකියා නිර්මාණ**

- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන්
- අවශ්‍යතා මත පුහුණු වැඩසටහන්
- උද්‍යාන අලංකරණය
- අවධානමට ලක්වූවන් සඳහා පුහුණු වැඩසටහන්
- ස්වයං රැකියා වැඩසටහන්
- තාක්ෂණික සහය වැඩසටහන්

**රැකියා ප්‍රවර්ධන**

- රැකියා පොළ
- රැකියා සමාජ වැඩසටහන
- රැකියා සඳහා යොමු කිරීම
- රැකියා 100 වැඩසටහන

**වෘත්තීය මාර්ගෝපදේශන**

- විශ්ව විද්‍යාල
- පාසැල් වැඩසටහන් (උසස් පෙළ/ සාමාන්‍ය පෙළ)
- ගුරුවරුන් සඳහා
- රැකියා විරහිත තරුණ පිරිස සඳහා
- දෙමව්පියන් සඳහා
- හසර සඟරාව
- අවධානමට ලක්වූවන් සඳහා
- වෘත්තීය මංපෙත්

### මහජන රැකියා සේවා මධ්‍යස්ථානය

මේ අංශය රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය යටතේ ක්‍රියාත්මක වේ. දිවයිනේ දිස්ත්‍රික්ක 24 ක මෙම මහජන රැකියා සේවා මධ්‍යස්ථාන (PES) ක්‍රියාත්මක වේ. ප්‍රධාන ජාතික මහජන රැකියා සේවා මධ්‍යස්ථානය (National PES) බත්තරමුල්ල කාර්යාල පරිශ්‍රයෙහි ස්ථාපිත කර ඇත.

දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථාන මගින් සිදු කරනු ලබන කාර්යයන් වන්නේ,

- රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම.
- පුරප්පාඩු සහ ආයතන ලියාපදිංචි කිරීම.
- ආයතනවල පුරප්පාඩු සොයා බැලීම සඳහා කටයුතු කිරීම.
- රැකියා අපේක්ෂිතයින්ගේ රැකියා පුරප්පාඩු පිළිබඳ ලේඛණ සකස් කිරීම.
- සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් තහවුරු කර ගැනීම.
- රැකියා ගැලපීම් හා සම්මුඛ පරීක්ෂණ සඳහා යොමුකිරීම.
- රැකියා ගත කිරීම් හා පසුවිපරම්
- වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් සැපයීම.
- පුහුණුව සඳහා පහසුකම් සැපයීම.
- රැකියා තත්ත්වයන් පිළිබඳව සංඛ්‍යා ලේඛණ රැස්කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.
- විදේශීය රැකියා අවස්ථා සඳහා මඟපෙන්වීම.
- දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන සංවිධානය කර පැවැත්වීම.

රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම ක්‍රම කිහිපයකට සිදුවේ. ප්‍රාදේශීය මට්ටමේ මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් විසින් හා රැකියා පොළවල්, රැකියා සේවා මධ්‍යස්ථාන හරහා ලබා දෙන තොරතුරු මඟින් මෙම තොරතුරු ලබා ගැනේ.

රැකියා අපේක්ෂිතයින්ගේ අපේක්ෂාවන් පදනම් කරගෙන වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සංවිධානය කෙරේ.

### මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය

ශ්‍රම වෙළඳපල තොරතුරු විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන්, පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයන් සඳහා ද අවශ්‍ය වේ.

ශ්‍රම වෙළඳපළ තොරතුරු රැස්කිරීමේදී සීඝ්‍රව වෙනස්වන කුසලතා සපිරි මානව සම්පත සඳහා ශ්‍රම වෙළඳපල ඉල්ලුම මනාව අධීක්ෂණය කිරීම හා තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ශ්‍රම වෙළඳපල තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කිරීම හා බෙදාහැරීම සුදු කරනු ලබයි.

එමෙන්ම ලංකාවේ කාලීන හා සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන ලෙස ශ්‍රම වෙළඳපල පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, ශ්‍රම ඉල්ලුම හා සැපයුම පිළිබඳ අධ්‍යයන සිදු කිරීම හා එම තොරතුරු බෙදා හැරීම ශ්‍රම වෙලඳපළ ඒකකයෙන් සිදුකරයි. ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව හා පාසල් පාදක දත්ත අත්පොත මේ මගින් ප්‍රකාශයට පත්කරනු ලබයි.

### ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2017 වර්ෂයේ ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය හා සම්බන්ධ ප්‍රගතිය.

- ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය වර්තමාන රජයේ මධ්‍යකාලීන සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නැවත සංශෝධනය කරන ලදී.
- එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සෘජුවම අදාල වන බවට හදුනා ගෙන ඇති අමාත්‍යාංශ 25ක් වෙතින්, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2017 - 2020 කාලසීමාවට අදාල වන පරිදි සංශෝධනය කිරීමට යෝජනා කැදවන ලදී.
- අමාත්‍යාංශ 17 කින් සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ලබා දී ඇති අතර අනෙකුත් අමාත්‍යාංශ 8 ක් වෙතින් ලබා දී ඇති ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කෙරෙමින් පවතී.

- ප්‍රතිපත්තිය සමඟ සම්බන්ධ වී ඇති අමාත්‍යාංශ වලින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳව ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ කටයුතු ද මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති මෙහෙයුම් ඒකකය මගින් සිදු කරනු ලබයි.

| | වැඩසටහන/<br>ක්‍රියාකාරකම | 2017 වසර සඳහා වූ ඉලක්ක | | 2017/01/01 දින සිට 2017/12/31 දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි) | භෞතික | මූල්‍ය (රු.මි) |
| | **රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය** | | | | |
| 1 | අ.පො.ස සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 2000 | 1.000 | 2132 | 1.226 |
| 2 | අ.පො.ස උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1450 | 0.200 | 1384 | 0.429 |
| 3 | ස්වයං රැකියා පෙළඹවීම් වැඩසටහන | 312 | 0.926 | 348 | 0.884 |
| 4 | වෘත්තීය අභියෝග ජය ගැනීම | 100 | 0.876 | 105 | 0.936 |
| 5 | උපාධි අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන අභ්‍යන්තර/ බාහිර | 20 | 0.755 | 20 | 0.795 |
| 6 | ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 25 | 0.709 | 32 | 0.664 |
| 7 | දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | 306 | 0.910 | 362 | 0.817 |
| 8 | වෘත්තීය මංපෙත් වැඩසටහන | 7 | 0.180 | 11 | 0.185 |
| 9 | හසර සඟරාව මුද්‍රණය | 2 | 0.300 | 1 | 0.159 |
| 10 | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 24 | 0.696 | 40 | 0.700 |
| 11 | රැකියා සමාජ වැඩසටහන | 24 | 0.859 | 24 | 0.838 |
| 12 | රැකියා 100 වැඩසටහන | 30 | 0.630 | 29 | 0.582 |
| 13 | අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 40 | 0.480 | 138 | 0.461 |
| 14 | තාක්ෂණික සහය වැඩසටහන | 45 | 0.540 | 45 | 0.561 |
| | **මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය** | | | | |
| 15 | මූල්‍ය ක්ෂේත්‍ර රැකියා පැතිකඩ | 100% | 0.250 | 100% | 0.132 |
| 16 | විදුලිය, ගෑස් ඉන්ධන හා ජල සැපයුම් ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ | 100% | 0.250 | 70% | 0.008 |
| 17 | ධීවර ක්ෂේත්‍රයේ  රැකියා පැතිකඩ අධ්‍යයනය | 100% | 0.250 | 100% | 0.293 |
| 18 | රාජ්‍ය අංශයේ වෘත්තීය ඉදිරි මාර්ගය පිළිබඳ අධ්‍යයනය | 100% | 0.250 | 100% | 0.294 |
| 19 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව | 100% | 0.300 | 100% | - |
| 20 | ස්වයං රැකියා ශක්‍යතාවය අධ්‍යයනය කිරීම | 100% | 0.400 | 90% | 0.006 |
| 21 | සමාජ ආර්ථික දත්ත අත්පොත | 100% | 0.300 | 100% | 0.673 |
| | **මහජන රැකියා සේවා මධ්‍යස්ථානය** | | | | |
| 22 | මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම හා ආරම්භ කිරීම | 6 | 2.980 | 6 | 2.987 |
| 23 | මහජන රැකියා සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම | 24 | 2.000 | | 1.410 |
| | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | | | | 30,697 |
| | රැකියා පුරප්පාඩු ලියාපදිංචි කිරීම | | | | 21325 |
| | රැකියා ගැලපීම | | | | 25014 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රැකියා ගත කිරීම | | | | 4285 |
| 24 | දිස්ත්‍රික් රැකියා පොළ පැවැත්වීම | 12 | 1.863 | 11 | 1.732 |
| 25 | රැකියා සේවා සැපයීමට ශ්‍රම වෙළඳපල තොරතුරු පද්ධතියක් ස්ථාපනය - මාර්ගගත අන්තර්ජාල බිහිදොරක් | 100% | 3.000 | 20% | 1.853 |
| **සුනිසි මෙහෙවර** | | | | | |
| 26 | ක්ෂුද්‍ර රෝපණ පදනම් කර ගත් මල් වගා ව්‍යාපෘතිය | 4 | 1.300 | 4 | 1.200 |
| 27 | බදුල්ල දිස්ත්‍රික්කයේ ආබාධිත තැනැත්තන් සිටින පවුල් සඳහා රැකියා නිර්මාණ වැඩසටහන | 7 | 0.165 | 7 | 0.165 |

රැකියාගත කිරීම් 2017/12/31 දක්වා ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | සෘජු රැකියා ගත කිරීම් | | ස්වයං රැකියාලාභින්/- ව්‍යවසායකයින් බිහි කිරීම |
|---|---|---|---|
| | මහජන රැකියා සේවා මධ්‍යස්ථාන මගින් | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් | |
| මහනුවර | 261 | 349 | 87 |
| කෑගල්ල | 158 | 370 | - |
| කොළඹ | 340 | 66 | - |
| රත්නපුර | 190 | 282 | - |
| බදුල්ල | 150 | 253 | 16 |
| කුරුණෑගල | 585 | 374 | 211 |
| කළුතර | 259 | 309 | 159 |
| ගාල්ල | 160 | 177 | 26 |
| මඩකලපුව | 131 | 268 | 105 |
| ගම්පහ | 305 | 332 | 46 |
| මාතර | 291 | 360 | 17 |
| පුත්තලම | 87 | 212 | 289 |
| හම්බන්තොට | 303 | 306 | - |
| අනුරාධපුර | 143 | 45 | - |
| යාපනය | 284 | 279 | 183 |
| කිලිනොච්චිය | 15 | 17 | 50 |
| ත්‍රිකුණාමලය | 54 | 24 | 7 |
| නුවරඑළිය | 0 | 43 | - |
| මාතලේ | 124 | 283 | 10 |
| අම්පාර | 65 | 235 | 144 |
| පොළොන්නරුව | 116 | 2 | 54 |
| මොණරාගල | 128 | 112 | - |
| වවුනියාව | 65 | 35 | 66 |
| මන්නාරම | 50 | 48 | 31 |
| මුලතිව් | 21 | - | 10 |
| **එකතුව** | **4285** | **4781** | **1511** |

දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | ස්ථානය | රැකියා අපේක්ෂිතයන් ගණන | සහභාගි වූ ආයතන ගණන | පුහුණු ආයතන ගණන | රැකියා ගැලපීම |
|---|---|---|---|---|---|
| ගාල්ල | ලබුදූව | 918 | 32 | 05 | 421 |
| බදුල්ල | හාලිඇල | 854 | 30 | 03 | 650 |
| බදුල්ල | ඌවපරණගම | 1251 | 28 | 02 | 820 |
| ගම්පහ | මිනුවන්ගොඩ | 674 | 38 | 07 | 1504 |
| ත්‍රිකුණාමලය | මැක්වීර් ක්‍රීඩාංගණය | 710 | 38 | 05 | 700 |
| නුවරඑළිය | නගර ශාලාව | 559 | 45 | 03 | 391 |
| මොණරාගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 820 | 30 | 03 | 353 |
| මාතර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 768 | 25 | 07 | 850 |
| හම්බන්තොට | තංගල්ල | 920 | 26 | 07 | 685 |
| පුත්තලම | හලාවත | 729 | 38 | 04 | 739 |
| කළුතර | පානදුර බාලිකා විද්‍යාලය | 510 | 42 | 7 | 758 |
| **එකතුව** | | **8713** | **372** | **53** | **7871** |

**විශේෂ වැඩසටහන් -**

1. ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රම පාදක කොට ගත් මල් වගා ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ නියමු ව්‍යාපෘතිය - සුනිසි මෙහෙවර වැඩසටහනකි.

   මෙම ව්‍යාපෘතිය යටතේ රැකියා විරහිත උපාධිධාරීන් මල් වගා ක්ෂේත්‍රයට අදාල විවිධ ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය කිරීම, ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රම මගින් නිපදවන රෝපණ ද්‍රව්‍ය වගා තවාන් හිමි ව්‍යවසායකයින් බිහි කිරීම හා සංවර්ධනය, ක්ෂුද්‍ර/ පටක රෝපණ ක්‍රම භාවිතා කර මුලික රෝපණ ද්‍රව්‍ය නිපදවන ව්‍යාපාරික මට්ටමේ විද්‍යාගාරයක් ස්ථාපිත කර ඒ මගින් සෘජුව හා වක්‍රව රැකියා නිර්මාණය හා ව්‍යවසායකයින් සංවර්ධනය අපේක්ෂා කරනු ලබයි.

   මෙම පුහුණු වැඩසටහන් මාලාවේ උපාධිධාරී සහ උපාධි අපේක්ෂිතයන් සඳහා වූ වැඩසටහන අගෝස්තු මස 4 -9 දිනවල පවත්වා ඇති අතර එයට අමතරව ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් වෙනුවෙන් වැඩසටහන් 3 ක් පවත්වන ලදි.

2. බදුල්ල දිස්ත්‍රික්කයේ ආබාධිත තැනැත්තන් සිටින පවුල්වල ගෘහණියන් හා දිස්ත්‍රික්කයේ තනි මාපිය පවුල්වල කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් බලගැන්වීම හා ඔවුන් ආර්ථිකයේ කොටස්කරුවන් කරවීම සඳහා වන ව්‍යාපෘති යෝජනාව. - සුනිසි මෙහෙවර වැඩසටහනකි.
   මෙම වැඩසටහන 2017 නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන්හිදී පවත්වන ලදි.

3. SYIB පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා මෙම පුහුණුව පවත්වන ලදි.

4. කොරියානු රාජ්‍ය තාන්ත්‍රික මැදිහත් වීම මත සේවා නියුක්තිය හා ශ්‍රම වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති උපදේශන වැඩසටහන.

04

# ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින නිල වශයෙන් ස්ථාපිත කරන ලද අතර 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කරන ලදී. එම ආයතනය, කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශව හවුල්කරුවන් වන සේව්‍ය පාර්ශවය, වෘත්තීය සමිති නියෝජනය වන සේවක පිරිස් හා රාජ්‍ය නිලධාරින්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මගින් පාලනය වේ.

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වර්තමානයේදි කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර කම්කරු දෙපාර්තමේන්තුව, අනෙකුත් රජයේ ආයතන, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයේ ආයතන සමග සහයෝගීව කටයුතු කරනු ලබයි. තවද, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ජාත්‍යන්තර කම්කරු සංවිධානය වැනි ජාත්‍යන්තර ආයතන සමඟද එක්ව කටයුතු කරන අතර ඉන්දියාවේ වී.වී.ගිරි (V.V.Giri) ජාතික කම්කරු ආයතනය සමඟ අන්‍යෝන්‍ය සහයෝගීතාවය සඳහා අත්සන් කළ අවබෝධතා ගිවිසුම දීර්ඝ කිරීම සඳහා කටයුතු සකස් කර ඇත.

කම්කරු අණපනත්, නිති රීති රෙගුලාසි පිළිබඳව මෙන්ම විවිධ කළමණාකරන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුවත් එලදායි ශක්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සංවිධානය හා මෙහෙයවීම මෙම ආයතනය මඟින් සිදුකරනු ලබයි.

මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය තුළ පහත දැක්වෙන ප්‍රධාන අංශ ක්‍රියාත්මක වේ.

i) පුහුණු හා සංවර්ධන අංශය
ii) පර්යේෂණ, සැලසුම් හා ප්‍රකාශන අංශය
iii) පාලන හා මුදල් අංශය

2017-01-01 සිට 2017-12-31 දක්වා සිදුකළ වැඩසටහන් වල ප්‍රගතිය

| වැඩසටහන් විස්තරය | සැලසුම් කළ වැඩසටහන් සංඛ්‍යාව | අපේක්ෂා කළ ආදායම(රු.) | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | ලද ආදායම (රු.) |
|---|---|---|---|---|
| ඩිප්ලෝමා පාඨමාලාවන් | 6 | 7,155,000 | 5 | 7,235,000.00 |
| එක් දින වැඩසටහන් | 52 | 3,120,000 | 51 | 3,721,050.00 |
| දෙ දින වැඩසටහන් | 40 | 4,800,000 | 40 | 5,182,700.00 |
| තුන් දින වැඩසටහන් | 12 | 1,920,000 | 10 | 1,449,000.00 |
| විශේෂ වැඩසටහන් | 12 | 3,840,000 | 23 | 2,420,100.00 |
| සහතිකපත්‍ර පාඨමාලා | 12 | 2,340,000 | 8 | 2,328,000.00 |
| වැඩමුළු | 4 | 1,020,000 | 8 | 5,344,625.00 |
| විභාග පැවැත්වීම | 5 | 200,000 | 18 | 1,666,000.00 |
| Research Projects | 2 | 1,000,000 | 1 | 1,250,000.00 |

### 2017 වර්ෂයේ විශේෂ ක්‍රියාකාරකම්

- එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධාන සමඟ එකතුවෙන් “ශ්‍රී ලංකා ශ්‍රම බලකායෙන් කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම” යන තේමාව යටතේ පර්යේෂණයක් ආරම්භ කිරීම.

05

# ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. මෙරට තුළ මනා සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය අනතුරු හා වෘත්තීය රෝග වැළකීම හා නිවැරදි ආරක්ෂිත ප්‍රතිපත්තියක් හා ක්‍රමවේදයන් පිළිපැදීම තුළින් යහපත් වැඩ පරිසර තත්ත්වයක් සෑම පුද්ගලයෙකුටම ලබාදීමට මෙම ආයතනය නිරතුරුවම කැපවී සිටින අතර මෙවැනි පුහුණුවක් තුළින් ප්‍රතිලාභ ලබාගත හැකි සේවක සේව්‍ය හා ඕනෑම පුද්ගලයකු සඳහා අවශ්‍ය අධ්‍යාපනයද මෙම ආයතනය විසින් ලබාදෙනු ලබයි.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය අපනයන සැකසුම් කලාපයේ පිහිටුවා ඇති ආනයන අපනයන සමාගම් සමග මෙන්ම නිෂ්පාදන ක්ෂේත්‍රයේ සමාගම් හා වැවිලි ක්ෂේත්‍රයේ සමාගම් සමඟ එක්ව ඒ ආයතනවල වැඩ කරන සේවකයන්ගේ ආරක්ෂාවට හා සෞඛ්‍ය ආරක්ෂා කිරීම උදෙසා විවිධ වැඩසටහන්, දැනුවත් කිරීම් රාශියක් පසුගිය කාලයන්හි සිදු කොට ඇත. මෙම වසරේ දී ආයතනයේ සේවා කටයුතු ඉහළ මට්ටමකට ගෙන ඒමට කටයුතු කළ අතර ඒ පිළිබඳව හා මෙම වසර තුළ ආයතනයේ සේවාවන් පිළිබඳ සමාලෝචනය මෙහි ඇතුලත් වේ.

**දැක්ම**

සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුභසාධනය ලබාදීම.

**මෙහෙවර**

සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා සියලු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන් සවිබලගැන්වීම

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්

- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- වැවිලි අංශයේ වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උසස් සහතිකය
- බොයිලේරු ක්‍රියාකරවන්නන් පුහුණු කිරීම
- කර්මාන්තයන් පිළිබඳ වැඩ අධ්‍යයන වැඩසටහන
- කර්මාන්ත ක්ෂේත්‍රයේ හෙදියන් පුහුණු කිරීම
- රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය
- කාර්යාලයීය කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය
- පරීක්ෂණාගාරවල වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය
- රසායනික ද්‍රව්‍ය ආරක්ෂා සහිතව පරිහරණය කිරීම
- ආහාර පරිහරණය කරන්නන් සඳහා සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය
- ආතති කළමනාකරණ පුහුණු වැඩසටහන

## පාරිසාරික සමීක්ෂණ

- වාතයේ තත්ත්වය සමීක්ෂණය කිරීම සදහා Indoor Air Quality හා දුම් පරීක්ෂා කිරීම සඳහා Flu Gas Analyzer meter උපකරණය භාවිතා කිරීම
- කර්මාන්තය තුළ දූවිලි මට්ටම් සමීක්ෂණය කිරීම හා දූවිලි පොම්ප උපකරණ භාවිතා කිරීම.

- ඝෝෂා මට්ටම සමීක්ෂණය කිරීම හා ශබ්ද මැනීමට Sound Level Meter උපකරණය භාවිතා කිරීම.
- උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම හා Heat Stress Meter (තාප ආතති) දර්ශකය භාවිතා කිරීම.

### වෛද්‍ය පරීක්ෂණ

- ශ්‍රවණ තත්වය මැනීමේ පරීක්ෂණ
- රුධිර විශ්ලේෂණය
- වැඩ කිරීමට යෝග්‍යතාව තක්සේරු කිරීම
- පෙනහළු ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂණ
- දෘෂ්ටි පරීක්ෂණ

### වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනයේ සිද්ධි කළමනාකරණය සහ පරිපාලන සේවය

2017.01.01 - 2017.12.31 දින දක්වා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ විශේෂ වැඩසටහන් හා ඒවායේ මුල්‍ය හා භෞතික ප්‍රගතිය.

| | පැවැත් වූ පාඨමාලාව | පාඨමාලා ගණන | සහභාගි වූ සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 03 | 133 | 12.82 |
| 2 | ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 05 | 190 | 8.83 |
| 3 | ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සඳහා දෙදින වැඩමුළුව | 01 | 35 | 0.262 |
| 4 | අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ එක්දින වැඩමුළුව | 01 | 11 | 0.055 |
| 5 | බෝයිලේරු ආරක්ෂාව පිළිබඳ එක්දින වැඩමුළුව | 01 | 16 | 0.064 |
| 6 | හෙදියන් සදහා වු එක්දින වැඩමුළුව | 01 | 18 | 0.630 |
| 7 | ඇඟලුම් ක්ෂේත්‍රය අලලා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබද දැනුවත් කිරීමේ දෙදින වැඩමුළුව | 01 | 25 | 0.187 |
| 8 | අනාරක්ෂිතභාවය හා අනතුරු සහිත ස්ථානවල වැඩකිරීම පිළිබඳ එක්දින වැඩමුළුව | 01 | 85 | 0.297 |
| 9 | සීමා සහිත අවකාශ හා අවධානම් හදුනාගැනීම පිළිබද එක්දින වැඩමුළුව | 01 | 30 | 0.030 |
| 10 | සුපරීක්ෂකවරුන් සදහා වු එක්දින සුරක්ෂිතතා වැඩමුළුව | 01 | 12 | 0.042 |
| 11 | ප්‍රථමාධාර භාවිතය පිළිබද තෙදින වැඩමුළුව | 01 | 12 | 0.126 |
| 12 | ඉදිකිරීම් ක්ෂේත්‍රය සදහා වු තෙදින වැඩමුළුව | 01 | 09 | 0.094 |
| 13 | විදුලි ආරක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ දෙදින වැඩමුළුව | 01 | 22 | 0.165 |
| 14 | රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ එක්දින වැඩමුළුව | 01 | 13 | 0.065 |
| 15 | OSHAS 8001, 8002 ප්‍රමිති පිළිබඳ එක්දින වැඩමුළුව | 01 | 14 | 0.070 |

### විශේෂ වැඩසටහන්

**ගංවතුරෙන් ආපදාවට ලක්වූවන් සදහා වෛද්‍ය වැඩසටහන**

රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වූ ගංවතුර උවදුර නිසා අපදාවට ලක් වූ එම ප්‍රදේශයේ ජනතාව වෙත සහනාධාර ලබාදීමත්, වෛද්‍ය කඳවුරු පහක් ආපදාවට ලක් වූ ප්‍රදේශයන්හි ස්ථාපිතකර වෛද්‍ය පහසුකම් සැපයීමත් සිදුකරන ලදී. මෙය ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ සහයෝගයෙන් රත්නපුර, බටුගෙදර, මාරපන, පැල්මඩුල්ල, කහවත්ත යන ප්‍රදේශ ආවරණය කරමින් පවත්වන ලදී.

ඊට අමතරව රැකියාව නිසා අත් පා අහිමි වුවන් නැවත සමාජගත කිරීමේ වැඩසටහනක්, ජපන් භාෂා පාඨමාලාවක් හා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 04 ක් පවත්වන ලදී.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව**

මෙම පාඨමාලාව සඳහා න්‍යායාත්මක මෙන්ම ප්‍රයෝගික දැනුම ලබාදෙන අතර ඒ සඳහා එම කණ්ඩායම් ක්ෂේත්‍ර චාරිකාවන් දෙකක් සඳහාද සහභාගි කරවීම මෙම පාඨමාලාවේ තවත් අංගයකි. පාඨමාලාව හැදෑරීම තුළින් ලද පුහුණුවෙන් තම සේවා ස්ථානයන්වල වඩාත් සුරක්ෂිත වැඩබිමක් නිර්මාණය කර ගැනීමට ඔවුන්ට හැකියාවක් ලැබෙන අතර ඒ තුළින් වැඩකරන සේවකයන්ගේ ආරක්ෂාවට මනා පිටිවහලක් වී ඇත. එසේම වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් ලෙස විවිධ ක්ෂේත්‍රයන්ට මහඟු දායකත්වයක් ලබාදීමට හැකි පිරිසක් මෙම ආයතනය තුළින් බිහිකර ඇත. එසේම මෙම පාඨමාලාව හැදෑරීමෙන් පසු විදේශිය රැකියා සඳහා සුදුසුකමක් වන අතර මේ වන විටත් පාඨමාලාව සාර්ථකව නිමකළ සිසුන් විදේශීය රටවල සේවා නියුක්තව සිටියි.

**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

මෙහි සියලු පාඨමාලාවක් සඳහා සිසුන් 140 දෙනෙකු සහභාගි වූ අතර, ඔවුන් සියලුදෙනාම සාර්ථක ලෙස පාඨමාලාව නිම කරන ලදි. මේ තුළින් මෙම පුහුණු නිළධාරින්ගේ සේවා ස්ථාන තුළ වෘත්තීය අනතුරු අවම කර ගැනීමට පිටිවහලක් වී ඇත. මේ වනවිට වැඩි ප්‍රමාණයක් සුරක්ෂිතතා නිළධාරින් ලෙස දැනට සේවයේ යෙදී සිටිති. වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය පිළිබඳ උනන්දුවක් දක්වන උසස් පෙළ සමත් ඕනෑම අයෙකුට මෙම පාඨමාලාව හැදෑරිය හැක. මෙහි දී විශේෂත්වයන් වනුයේ මෙම සහතික පත් පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ආරක්ෂක ක්ෂේත්‍රයේ ප්‍රධාන නිලධාරින් සහභාගී වීමත් ය.

**හෙදියන් සඳහා වු එක් දින පුහුණු පාඨමාලාව**

2017 පෙබරවාරි 28 දින හෙදියන් සඳහා වු එක් දින පුහුණු පාඨමාලාව සාර්ථකව පැවැත්විණි. වැඩකරන ජනතාව සමග නිතර සබඳතා පවත්වමින් ඔවුන්ගේ සෞඛ්‍ය පිළිබදව නිතර සොයා බලා ඉතා වැදගත් කාර්යභාර්යක් ඉටුකරන හෙද වෘත්තීකයන් සඳහා නැවත මෙම පාඨමාලාව ආරම්භ කිරීමට ආයතනය තීරණය කරන ලදී.

**පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන - මඩකලපුව/ වව්නියාව**

මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබුයේ ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය එක්වය. මේ සඳහා ජාතික සේවක සංගමය, මඩකලපුව/ වව්නියාව දිස්ත්‍රික්කවල සිටින කාර්මික විද්‍යාලයන්හි පුහුණු ශිෂ්‍යයින් 50 ක් සහභාගි විය. මෙම ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය රුපියල් මිලියන 2.29 ක මුදල් ප්‍රමාණයක් වෙන්කර ඇත. පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන මඩකලපුව, වව්නියාව යන දිස්ත්‍රික්කයන්හි පවත්වන ලදී. එහි දී ප්‍රධාන වශයෙන් වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පුහුණු පාඨමාලා දින 10 ක් පුරා මෙම ස්ථාන ද්විත්වයෙහි පවත්වන ලදී.

## ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය

කැබිනට් මණ්ඩලය මඟින් සෑම වර්ෂයකම ඔක්තෝබර් මස 2 වන සතිය රැකියාවල නියුක්ත වෘත්තිකයන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය ප්‍රකාශයට පත් කරන ලදී .

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සමුළුව 2017 ඔක්තෝම්බර් 11 වන දින පවත්වන ලදී.

| වැඩසටහන | ඇස්තමේන්තු ගත මුදල(රු,) | භෞතික ප්‍රගතිය (රු,) | මුල්‍ය ප්‍රගතිය (රු,) |
|---|---|---|---|
| ජාතික වෘත්තීය සුරක්ෂිතතා සමුළුව | 400*5000 = 2,000,000.00 | 422*5000<br>සමරු කලාපය<br>අනුග්‍රාහක භවතුන්ගෙන් ලැබුණ මුල්‍ය | 2,110,000.00<br>355,000.00<br><br>2, 300,000.00 |

මෙම සම්මන්ත්‍රණය සඳහා අරාධිතයින් 75 දෙනෙකු සහභාගි විය. දේශීය විදේශිය සම්පත්දායකයින් වෘත්තීය සුරක්ෂිතතා සෞඛ්‍ය සම්මේලනය සඳහා සහභාගි විය.

අරමුණු

මෙවර ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය 2017 ඔක්තෝම්බර් මස 09 වන දින සිට ඔක්තෝම්බර් 13 වන දින දක්වා පැවැත්වෙන අතර ඒ සම්බන්ධයෙන් පහත ක්‍රියාකාරකම් අප ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් සූදානම්කර පවත්වන ලදී.

1. පාසල් සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සම්මන්ත්‍රණය - 2017 ඔක්තෝම්බර් 09 - සිරිපියරතන විද්‍යාලය, පාදුක්ක

ඒ අනුව 2017 ඔක්තෝම්බර් 09 දින පාසල් සුරක්ෂිතතා වැඩමුළුව හා සම්මන්ත්‍රණය පාදුක්ක සිරි පියරතන මධ්‍ය මහා විද්‍යාලයෙහි පැවැත්වීය. මෙම වැඩසටහනෙහි ප්‍රධාන ඉලක්කය හා අරමුණ වනුයේ පාසල් ළමුන්ගේ සුරක්ෂිතතාවය පිළිබඳ ආකල්ප සොයාබලා ඔවුන්ගේ සුරක්ෂිතතාවය පිළිබඳ දැනුම වර්ධනය කිරීමත්, එමෙන්ම ප්‍රායෝගික පුහුණුව ලබාදීමත් වේ.

මෙම වැඩසටහන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ ප්‍රධානත්වයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාත් සිරි පියරතන මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිතුමාත් පාසලේ සිසුන් 100 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදුකරන ලදී.

2. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය - 2017 ඔක්තෝම්බර් 11 - කිංස්බරි හෝටලය (Kingsbury)

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය 2017 ඔක්තෝම්බර් 11 වන දින පෙ.ව 9.00 සිට කොළඹ කිංස්බරි හෝටලයේ දී පැවැත්වීය. මෙම සම්මන්ත්‍රණය සඳහා 500 කට අධික පිරිසකගේ සහභාගිත්වය සිදු විය. මෙහි තේමාව වූයේ වෘත්තීය අනතුරුවලින් වැළැකීම හා ආරක්ෂාව වේ. මෙහි මූලික අරමුණ වනුයේ වෘත්තිකයන්ගේ සේවා සුරක්ෂිතතාවය හා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අපේ රටේ හා අනෙකුත් ලෝකයේ රටවල්වල නව තාක්ෂණය හා නව ක්‍රමවේදයන් භාවිතය, සෞඛ්‍ය ප්‍රමිති පිළිබඳ අවබෝධය හා වර්ධනය වැඩිකරමින් සහභාගිවන සමාජිකයන් දැනුවත් කිරීමය. මෙහි දී විදේශීය දේශීය සම්පත්දායකයින් හය දෙනෙකුගේ සහභාගිත්වය සිදුවිය. එසේම හරවත් දේශන කිහිපයක් මෙම සම්මන්ත්‍රණයට ඇතුලත් විය.

**රෝග නිර්ණ කඳවුරු, අපනයන සැකසුම් කලාපය**

ශ්‍රම වාසනා අරමුදල හා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය එක්ව සංවිධානය කරන ලද වෛද්‍ය සායන තුනක් අපනයන සැකසුම් කලාපයන්හි පවත්වන ලදී. වෛද්‍ය කඳවුරු පවත්වන ලද අපනයන සැකසුම් වෙළඳ කලාප පහත පරිදිය.

- අවිස්සාවේල්ල අපනයන සැකසුම් කලාපය
- කොග්ගල අපනයන සැකසුම් කලාපය
- කටුනායක අපනයන සැකසුම් කලාපය

මෙම වෛද්‍ය කඳවුරු වලදී අප පහත පරීක්ෂණයන් සඳහා ප්‍රමුඛස්ථානය දෙනු ලැබීය.

- වෛද්‍ය පරීක්ෂණ
- රුධිර පරීක්ෂණ
- පෙනහළු පරීක්ෂණ
- කන් පරීක්ෂණ

එමෙන්ම මෙම පරීක්ෂණයන් සඳහා සහභාගී වූ සේවකයින් සංඛ්‍යාව

| පරීක්ෂණය | අවිස්සාවේල්ල සහභාගි වූ ප්‍රමාණය | කොග්ගල සහභාගි වූ ප්‍රමාණය | කටුනායක සහභාගි වූ ප්‍රමාණය |
|---|---|---|---|
| වෛද්‍ය පරීක්ෂණ | 151 | 137 | 371 |
| රුධිර පරීක්ෂණ | 151 | 107 | 188 |
| පෙනහළු පරීක්ෂණ | 75 | 88 | 106 |
| කන් පරීක්ෂණ | 61 | 77 | 75 |

06

# කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේදී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනත පනවා ඇත. මෙම පනතට යම් යම් අවස්ථාවන්හිදී සංශෝධන කිහිපයක් ඇතුළත් වූ අතර, අවසාන සංශෝධනය 2005 අංක 10 පනතින් සිදු කර ඇත. කම්කරු වන්දි උසාවිය, දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14 කින් ද සමන්විත වේ. අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු 3 කින් ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ද ඇතුළු තනතුරු 43 කින් සමන්විත වේ.

එසේම මෙම කාර්යාලය නඩු අංශය, ආයතන අංශය, ගිණුම් අංශය, බාලවයස්කාර වන්දි කටයුතු සහ රක්ෂණ බලපත්‍ර අංශයෙන් සමන්විත වේ.

කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාල කර ගන්නා අතර අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

### ප්‍රධාන අරමුණු

- රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරු වලින් තුවාල ලබන සේවකයින්ට වන්දි අයකර දීම
- රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට වන්දි අයකර දීම
- සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරු වලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි අයකර දීම

1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥා පනතේ බලතල හා විධිවිධාන අනුව කම්කරු වන්දි කොමසාරිස්ට හිමි ප්‍රධාන කාර්යභාරයන් වන්නේ,

1. රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු, වෘත්තීය රෝගාබාධ සහ මරණයකදී නම් යැපෙන්නන්ට වන්දි අයකර දීමේ කටයුතු (2005 අංක 10 දරණ අවසන් සංශෝධනයට අනුව ලබාදිය හැකි උපරිම වන්දි මුදල රු: 550,000/=කි.)
2. බාල වයස්කරුවන් වයස් පූර්ණත්වයට පත්වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරිකිරීම් බැංකුවේ ගිණුම් පවත්වා ගෙන යාම හා ඒවායේ පරිපාලන කටයුතු,
3. සේවකයන්ට සිදුවන අනතුරකදී සේවායෝජකයන් වන්දි ගෙවීම පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීම.
4. එමෙන්ම කම්කරු වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු.
5. සේවකයකුට අනතුරක් සිදුවූ විට එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීම.
6. ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව්වල සහ ගුවන් නැව්වල සේවකයන්ට ලංකාවෙන් පිටත දී සිදුවන අනතුරු සඳහා වන්දි අයකර දීම.

### 2017.01.01 සිට 2017.12.31 දක්වා ප්‍රගතිය (උසාවි කටයුතු)

| කාර්යය | 2017.01.01 - 2017.12.31 |
|---|---|
| විධිමත් ලෙස වාර්තාගත කරන ලද අනතුරු සංඛ්‍යාව | 485 |
| විභාගයට ගන්නා ලද ලිපිගොනු සංඛ්‍යාව | 3,008 |
| කටයුතු අවසන් කරන ලද වන්දි අයදුම්පත් සංඛ්‍යාව | 426 |

| | |
|---|---|
| ලියාපදිංචි කළ ගිවිසුම් සංඛ්‍යාව | 125 |
| මාරක අනතුරු සම්බන්ධයෙන් වන්දි ලෙස අයකර ගත් මුදල් රු. | 111,276,358.99 |
| මාරක නොවන අනතුරු වෙනුවෙන් උසාවි නියෝගයන් අනුව සේවා යෝජකයන් විසින් සේවකයන්ට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය රු. | 36,009,234.68 |
| ලියාපදිංචි කළ ගිවිසුම්පත් අනුව මාරක නොවූ අනතුරු වෙනුවෙන් සේවකයින්ට ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය රු. | 9,854,327.11 |
| මාරක අනතුරු සම්බන්ධයෙන් අයකර ගන්නා ලදුව බාලවයස්කාර යැපෙන්නන්ගේ ඉතිරිකිරීමේ ගිණුම්වල තැන්පත් කළ මුදල් ප්‍රමාණයන් රු. | 27,884,973.00 |
| බාලවයස්කරුවන් වෙනුවෙන් විවෘත කළ ගිණුම් සංඛ්‍යාව | 148 |
| බාලවයස්කරුවන්ගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වීමෙන් පසු නිදහස් කළ ගිණුම් සංඛ්‍යාව | 216 |
| නිදහස් කළ බාලවයස්කාර ගිණුම් වලින් ගෙවූ මුදල් ප්‍රමාණය රු. | 16,850,651.81 |

**2017.01.01 සිට 2017.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය.**

| විස්තරය | 2017 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2017 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වියදම රු. | ඉතිරිවීම් රු. | වියදම් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 29,388,000.00 | 28,871,447.00 | 516,553.00 | 98.24% |
| ප්‍රාග්ධන වියදම් | 1,265,000.00 | 1,096,427.00 | 168,572.00 | 86.67% |
| මුළු වියදම් | 30,653,000.00 | 29,967,874.00 | 685,125.00 | 97.76% |

07

# ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභ සාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල පනතේ අරමුණු 6 ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභ සාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තිකයින්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ශ්‍රම වාසනා අරමුදල වෙත ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලබා දෙන ජාතික සම්පත ලොතරැයි අරමුදල හැඳින්විය හැක. ජාතික සම්පත ලොතරැයි අලෙවිය ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර එම දායකත්වය වැඩිවීමත් සමඟ කම්කරු සුභ සාධනය උදෙසා සිදු කිරීමට නියමිත සේවාවන් ද වර්ධනය  කර ගත හැක.

**ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු**

(ආ) සේවා නියුක්තයන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම.
(ආ) සේවා  නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවකදී එම සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.
(ඇ) හදිසි අවස්ථාවල දී සේවා නියුක්තයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.
(ඈ) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටක දී ඔවුන්ට තාවකාලික ආධාර  සැපයීම.
(ඉ) ව්‍යසන අවස්ථාවල දී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම.
(ඊ) සේවා නියුක්තයන්ගේ සුභ සාධනය සදහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

**ශ්‍රම වාසනා අරමුදල සදහා ලැබීම.**

(අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්ය සඳහා කලින් කල සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්.
(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්
(ඇ) අරමුදල මගින් කරන ආයෝජන වලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්
(ඈ) ලොතරැයි වලින් ලැබෙන මුදල් ද ඇතුලුව, මේ පනත යටතේ ස්වකීය බලතල  ක්‍රියාත්මක කිරීමේදී සහ කර්තව්‍ය ඉටු කිරීමේදී අරමුදල වෙත ලැබෙන සියලු මුදල්.

ශ්‍රම වාසනා අරමුදල පෞද්ගලික අංශයේ සේවකයින් ආවරණය වන පරිදි පිහිටුවා ඇති අතර ස්වයං රැකියා කරනු ලබන පිරිස මෙමගින් ආවරණය නොවේ. ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය ධාරිතාව මත විවිධ වැඩසටහන් එක් එක් සීමාවන් තුළ ක්‍රියාත්මක කරනු ලැබේ. මූල්‍ය ධාරිතාව වැඩිවීමත් සමග එම සීමා වලින් ඔබ්බට තව දුරටත් සේවාවන් පුළුල් කිරීම 2012 වර්ෂයේදී සිදු කරන ලදී.

## වැඩසටහන්වල ප්‍රගතිය

| වැඩසටහන/ ක්‍රියාකාරකම | | 2017 වසර සඳහා වූ ඉලක්ක | | 2017.01.01 දින සිට 2017.12.31 දක්වා භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය රු. මි. | භෞතික | මූල්‍ය රු. මි. |
| 1 | වෛද්‍ය සායන කඳවුරු | 8 | 4 | 8 | 2.2 |
| 2 | සව්බල ගැන්වීමේ වැඩසටහන් | 8 | 4 | 8 | 3.4 |
| 3 | දැනුවත් කිරීමේ වැඩසටහන් | 28 | 1.5 | 22 | 0.4 |
| 4 | සුබසාධන වැඩසටහන් | 10 | 12 | 30 | 11.7 |
| 5 | කෘත්‍රිම අත් පා ලබා දීම | 42 | 3 | 1 | 0.18 |
| 6 | වෘත්තීය අධ්‍යාපන වැඩසටහන් | 12 | 0.6 | 1 | 0.03 |
| 7 | වෘත්තීය සෞඛ්‍ය ආරක්ෂණය හා දැනුවත් කිරීමේ වැඩසටහන් | 28 | 1 | 23 | 0.4 |
| 8 | නීති ආධාර වැඩසටහන් | 25 | 0.75 | 11 | 0.4 |
| 9 | වෛද්‍ය සහන | 10 | 0.5 | 3 | 0.1 |
| 10 | ශිෂ්‍යත්ව වැඩසටහන් | 100 | 7 | 74 | 4.6 |
| 11 | හදිසි ආපදා වැඩසටහන් | 4 | 6 | 8 | 4 |
| 12 | සම්මාන උළෙල වැඩසටහන් | 50 | 2.5 | 33 | 0.28 |
| 13 | ප්‍රවර්ධන වැඩසටහන් | 12 | 1 | 9 | 0.9 |
| 14 | දැන්වීම් හා පළකිරීම් | 30 | 3.5 | 29 | 1.5 |

## අමාත්‍යාංශයේ විශේෂ ක්‍රියාකාරකම්වලින් බිඳක්



ශ්‍රම වාසනා අරමුදල මඟින් ගාල්ල "නිල මෙහෙවර ජනපති ජංගම සේවය" අවස්ථාවේදී පවත්වන ලද සුභසාධන වැඩසටහන - 2017.01.14




මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මඟින් හාලිඇල පැවැත් වූ රැකියාපොළ 2017.02.18




කම්කරු නීති හා පරිචයන් පිළිබඳ විද්වත් කතිකාවත - 2017.1130



නවක කම්කරු නිලධාරීන් 191 දෙනෙක් සඳහා පත්වීම් ලබා දීම - 2017.12.01



කොරියානු මිනිස්බල දෙපාර්තමේන්තු නිලධාරීන් සමඟ සාකච්ඡාව - 2017.03.08




ජාත්‍යන්තර කාන්තා දින සැමරීම සඳහා ගාල්ලේදී පැවැත් වූ වැඩසටහන - 2017.03.08




ජාතික වෘත්තීය සුරක්ෂිතතා සෞඛ්‍ය ආයතනය මඟින් රත්නපුර දී සංවිධානය කළ වෛද්‍ය සායනය 2017.03.31



ශ්‍රම වාසනා අරමුදල මඟින් පොළොන්නරුවේදී "නිල මෙහෙවර ජනපති ජංගම සේවය" පවත්වන ලද සුභසාධක වැඩසටහන - 2017.03.11



මීතොටමුල්ල කුණු කන්ද නාය යෑමෙන් විපතට පත් සිසුන් සඳහා ශ්‍රම වාසනා අරමුදල මඟින් ශිෂ්‍යත්ව ලබා දීම - 2017.07.25



ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් කණ්ඩායම් හැඟීම් වර්ධනය සඳහා පැවැත්වූ වැඩමුළුව



කම්කරු උපදේශක සභා රැස්වීම 2017.11.22




කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ සම්මන්ත්‍රණය - 2017.10.10

**කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය**
தொழில், தொழிற் சங்க உறவுகள் மற்றும் சப்பிரகமுவ அபிவிருத்தி அமைச்சு
Ministry of Labour, Trade Union Relations and Sabaragamuwa Development

**ශ්‍රී ලංකාවේ අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත වූවන්ගේ ජීවන හා සේවා තත්ත්වයන් වර්ධනය කිරීම මෙන්ම රටේ නිෂ්පාදනය හා ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමට අවශ්‍ය වන කාර්මික සාමය සහ සේව්‍ය-සේවක සබඳතාව ස්ථාපනය කරමින් අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශයේ මූලික පරමාර්ථ වේ. සේවක ජනතාවගේ සුබසාධනය උදෙසා වරින්වර ඇති කරන ලද කම්කරු නීති හා අණපනත් අනුව මෙම අමාත්‍යාංශයට පැවරෙන කාර්ය භාරයද පුළුල්ය.**

இலங்கையில் நியதிச் சபைகள் மற்றும் தனியார்துறை நிறுவனங்களில் பணியாற்றுகின்ற அண்ணளவாக 8.5 மில்லியன் தொழிலாளர்களின் வாழ்க்கை மற்றும் தொழில் தரங்களை அதிகரித்தல் உட்பட தேசியஉற்பத்தி மற்றும் தொழில் உற்பத்தித்திறன் அதிகரிப்பிற்குத் தேவையான தொழில் அமைதி, தொழில்வழங்குநர் - தொழிலாளரிடையேயான உறவுகளை உருவாக்கி குறித்த கொள்கைகளைத் தயாரித்தல், அவற்றை அமுலாக்குதல் போன்றவை தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சின் பிரதான குறிக்கோள்களாகும். தொழிலாளர்களின் நலன்களை முன்னிட்டு அடிக்கடி உருவாக்கிக்கொண்ட தொழிற்சட்டங்கள், ஒழுங்குவிதிகளுக்கேற்ப இந்த அமைச்சிற்குப் பொறுப்பாக்கப்பட்டுள்ள கடமைகளும் விரிவானதாகும்.

Main objectives of the Ministry of Labour, Trade Union Relations and Sabaragamuwa Development are formulation of policies and implement those policies that establish the industrial peace and employer and employee relationship, which are pre-requisites for the increase of the production and the labour productivity, with the view of improving the quality of life and service conditions of the working population of about 8.5 million, who are employed in the private and semi-government sector of Sri Lanka. The functional area entrusted to this ministry gets broadened along with labour laws and legislations that are formed from time to time, for the welfare of the working people.

**තැ. පෙ. 1519, දෙවන මහල, කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 05.**
த. பெ. 1519, 2 ஆவது தளம், தொழில் செயலகம், நாரஹேன்பிட்டி, கொழும்பு 05.
**P. O. Box 1519, 2nd Floor, Labour Secretariat, Narahenpita, Colombo 05.**

PRINTEC | 0112 815 816